වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2023



+ 94 812 388651
direxag@sltnet.lk
www.dea.gov.lk

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
DEPARTMENT OF EXPORT AGRICULTURE

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
விவசாய மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
Ministry of Agriculture and Plantation Industries

2023

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ஏற்றுமதி விவசாயத் திணைக்களம்

DEPARTMENT OF EXPORT AGRICULTURE

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

விவசாய மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

Ministry of Agriculture and Plantation Industries

පටුන	පිටුව
01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය	05
1.1. හැඳින්වීම	05-06
1.2.ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	07
1.3.ප්‍රධාන කාර්යයන්	08
1.4.සංවිධාන සටහන	09
1.5.දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන	10
1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	
1.5.2. දිස්ත්‍රික් කාර්යාල	10
02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	11
2.1. විශේෂ ජයග්‍රහණ හා අත්පත් කර ගැනීම්	11-33
2.2. අභියෝග හා ඉදිරි ඉලක්ක	34
2.2.1. අභියෝග	34
2.2.2. අනාගත ඉලක්ක / අරමුණු	34-35
03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය	37
3.1.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	37
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	38
3.3.මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	39
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්	40
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	40
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	40
3.7.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	41
3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	41
3.9.විගණකාධිපති වාර්තාව	42-49
04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	50
4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	50
4.1.1.අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන	50-54
4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම්,අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්	54-55

05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේකාර්ය සාධනය 57

5.1. දෙපාර්තමේන්තුවට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 57-58

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 58-60

06.පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 60

6.1.සේවක සංඛ්‍යා කළමණාකරණය 61

6.2.ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය 61

6.3.මානව සම්පත් සංවර්ධනය 61-62

07.පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 63-68

ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව 69

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරාතන සමයේ සිට කුළුබඩු සඳහා කීර්ති නාමයක් දිනා සිටිය ද ජාතික මට්ටමෙන් මෙම කර්මාන්තය සඳහා අවධානය යොමු කෙරුණේ 1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින්ය. ඉන් පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP)සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ දෙපාර්තමේන්තුවේ එවකට කාර්යභාර්ය බවට පත්ව තිබූ මායිම් ඉඩම්වල කුළුබඩු වගා කිරීම වෙනුවට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරි බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. එතැන් සිට මෙම දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර, පර්යේෂණ මෙන්ම සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙය වීම් කටයුතු සිදු කරන ලදි. ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයේ ප්‍රවීණයා වෙමින් එහි සංවර්ධනය සහ ව්‍යාප්තිය පිළිබඳ දීප ව්‍යාප්ත ජාලයක් මඟින් දෙපාර්තමේන්තුව මෙම අංශයේ අදාල පාර්ශවකරුවන්ට පහසුකම් සපයයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ කුරුඳු, ගම්මිරිස්,කරාඹු, සාදික්කා,කරඳමුංගු,කෝපි, කොකෝවා, බුලත්, පුවක් ,වැනිලා, පැඟිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී කුළුබඩු බෝග පානීය භෝග සහ උත්තේජක භෝග අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙහි දී දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ අපනයන කෘෂි බෝග වගා වපසරිය වැඩි කිරීම, පවත්නා වගාවල ඵලදායීතා කටයුතු, පසු අස්වනු තාක්ෂණ ප්‍රවර්ධන වැනි සංවර්ධන කටයුතු හා නව ප්‍රභේද හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම සහ නවෝත්පාදන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට හඳුන්වා දීමයි. 2023 සැප්තැම්බර් මස සිට කුරුඳු භෝගය වෙනත් දෙපාර්තමේන්තුවක් යටතට පත් වුව ද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2023 වසර සඳහා සැලසුම් කර තිබූ කුරුඳු සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව 2023 වසරේ දෙපාර්තමේන්තුව සඳහා සෘජුව අයවැය මඟින් වෙන් වූ රුපියල් මිලියන 437 ක ප්‍රතිපාදන මඟින් දෙපාර්තමේන්තු සමස්ථ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

නිෂ්පාදන පරිමාව ඉහළ දමමින් අපනයන ආදායම ඉහළ නැංවීමේ දෙපාර්තමේන්තු ප්‍රධාන ඉලක්කය සපුරා ගැනීමේ දී වගා වපසරිය වාර්ෂිකව ඉහළ නැංවීම සඳහා යොමු කළ අවධානයට හා සාපේක්ෂව අපනයන භෝග වල අගය එකතු කිරීමේ නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ඉහළ වෙළඳපල වාසි ලබා ගැනීම පිළිබඳවද විශේෂ අවධානයක් 2023 වසර තුල දී යොමු කරන ලදි.

දේශගුණික කාලගුණික වෙනස්කම් හා වෙළඳපල මිලෙහි බලපෑම මත වුව ද 2022 රුපියල් මිලියන ක් 149,050.41 ක් වූ අපනයන ආදායම 2023 වන විට රුපියල් මිලියන 157,423.36 ක් දක්වා ඉහළ නංවා ගැනීමට විය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින් , පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍යවන්නා වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.


අරමුණු

අපනයන පරිමාව වැඩිකිරීම හා නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ඉපයීමක් සඳහා අපනයන කෘෂිබෝග අංශය සංවර්ධනය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මකභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමණාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශණ පවත්වාගෙන යාම.

1.4. සංවිධාන සටහන


සංවිධාන සැලැස්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංවර්ධන)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පර්යේෂණ)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (සංවර්ධන) I/II/III
අධ්‍යක්ෂ (පර්යේෂණ)
අධ්‍යක්ෂ (විශේෂ පර්යේෂණ)
අධ්‍යක්ෂ (නියාමන)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
කෘ.නි. (සැලසුම්)
කෘ.නි./ස.අ (පාලන)
කෘ.නි./ස.අ (ප්‍රගති මිහෙයුම්)
කෘ.නි./ස.අ (දිස්ත්‍රික්ක)
කෘ.නි./ස.අ (ප්‍රහුණු)
කෘ.නි./ස.අ (ව්‍යාප.ප්‍රි.)
කෘ.නි./ස.අ (සත්ත්වවිද්‍යා)
කෘ.නි./ස.අ (පැ.සං.)
කෘ.නි./ස.අ (ම.ප.මි)
කෘ.නි./ස.අ (උ.ප.මි)
කෘ.නි./ස.අ (ආ.ප.මි)
සං. ලේ
පර්.සං.ස/ සං.ස
කළ.ස
සං. නි
අය.සං.ස
ගණ.නි
ප්‍රා.ගා.නි
පරි.නි
ගොඩ.නි
ගොඩ.සේ.ස
දි.ව්‍යාප.නි.
පරි.නි.(අපනයන)
පරි.නි.(මම)
භාෂා පරි.
කා.නි.
සං. නි
කළ.ස
පර්.සං.ස/ සං.ස
සං. නි
කළ.ස
කෘ.නි.
සං. නි
කළ.ස
පර්.සං.ස/ සං.ස
සං. නි
කළ.ස
කෘ.නි.
සං. නි
කළ.ස
පර්.සං.ස/ සං.ස
සං. නි
කළ.ස
ගොඩ.නි
ගොඩ.සේ.ස

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන

1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධානඅංශ

1. සංවර්ධන අංශය
2. පර්යේෂණ අංශය
3. පාලන අංශය
4. ගිණුම් අංශය

1.5.2. දිස්ත්‍රික් කාර්යාල 17 ක් පහත අයුරින් ව්‍යාප්තව ඇත.

මධ්‍යම පළාත	- මහනුවර, මාතලේ, නුවරඑළිය
සබරගමුව පළාත	- කෑගල්ල, රත්නපුර
ඌව පළාත	- බදුල්ල, මොණරාගල
දකුණු පළාත	- ගාල්ල, මාතර, හම්බන්තොට
බස්නාහිර පළාත	- කොළඹ, කළුතර, ගම්පහ
වයඹ පළාත	- කුරුණෑගල(පුත්තලම දිස්ත්‍රික්කය ද ආවරණය වේ.)
නැගෙනහිර පළාත	- අම්පාර(මඩකලපුව දිස්ත්‍රික්කය ද ඇතුළත් වේ.)
උතුරු මැද පළාත	- අනුරාධපුර, පොළොන්නරුව

පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන වල පිහිටීම

1. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ
2. කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, පළොල්පිටිය, තිහගොඩ, මාතර
3. අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
4. ආර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
5. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය ,ගම්පොල
6. පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය හා පැළ තවාන, වල්පිට ,ගම්පහ
7. උප පර්යේෂණ මධ්‍යස්ථානය, කුණ්ඩසාලේ
8. උප පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ලඹ , ගලහ

දෙපාර්තමේන්තු මධ්‍යම පැළ තවාන්වල පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කය	-	සෙරපීස් පැළ තවාන - පොල්ගහවෙල
		හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද
		වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල
නුවරඑළිය දිස්ත්‍රික්කය	-	බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන
		මුල්හාල්කැලේ පැළ තවාන - වලපනේ
මාතලේ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ඇල්වල, උකුවෙල
මාතර දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය
කෑගල්ල දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ගස්නාව, නෙලුන්දෙනිය
ගම්පහ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - වල්පිට
හම්බන්තොට දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා අත්පත්කරගැනීම්

- 2023 වසරේදී අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් රු.මි. 390.00 ක ප්‍රතිපාදන වලින් වගා ව්‍යාප්ති වැඩසටහන, මධ්‍යම පැළ තවාන් සංවර්ධනය, ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන , අගය එකතු කිරීමේ වැඩසටහන , සන්නිවේදන වැඩසටහන් හා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා රු.මි. 381.3 ක් වැය විය. එය දෙපාර්තමේන්තුවට ලබා දුන් සමස්ත මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 97.7% ක් විය.

- අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ අපනයන කෘෂි කලාප වැඩසටහන යටතේ ලබා දුන් මුළු ප්‍රතිපාදන රු. මිලියන 21න් රු.මි. 20.029 ක් වැය වූ අතර එම වැඩසටහන යටතේ සාදික්කා, කරාඹු, කරඳමුංගු , වැනිලා , ගොරකා සහ කෝපි පැළ ප්‍රතිලාභීන් 9,822 ක් අතර බෙදා දෙන ලදී.

- 2023 පෙබරවාරි 01 වන දින සිට කුරුඳු, ගම්මිරිස් , කෝපි , කොකෝවා, පුවක් , සාදික්කා සහ කරාඹු යන බෝගයන්හි පැළයක් සඳහා අයකරනු ලබන ප්‍රතිලාභීන් විසින් දැරිය යුතු මුදල සහ දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන මුදල් සංශෝධනය කරන ලදී.

- 2023 වසරේ ක්‍රියාත්මක කරන ලද වගා ව්‍යාප්ති වැඩසටහන යටතේ නව වගා වැඩසටහන, කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන, අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන , පොකුරු ගම්මාන වැඩසටහන, කහ සහ ඉඟුරු වැඩසටහන හා පුවක් වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා රු. මි. 229.23 ක් වැය විය.
- 2023 වසරේ නව වගා වැඩසටහන යටෙත් අපනයන කෘෂි බෝග වගාවන් හෙක්ටයාර 1385.4 ක භූමි වපසරියක නව වගාවන් ආරම්භ කරන ලද අතර එය දෙපාර්තමේන්තුව මඟින් 2023 වසරේදී ඉලක්කගත වගා වපසරිය වූ හෙක්ටයාර 1520 න් 91.14 % ක් වූ අතර මෙම වැඩසටහන සඳහා රු. මි. 186.04 ක් වැය විය.

- ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කුළුබඩු ගෙවත්ත තුළින්ම නිෂ්පාදනය කර ගැනීම , ගෙවත්ත තුල කුඩා පරිමාණ ආර්ථික වගාවන් ඇති කිරීම ,මහා පරිමාණයෙන් වගා නොකෙරෙන අපනයන කෘෂිබෝග පොකුරු ගම්මාන ලෙස වගා කිරීම ,ඉඩමේ ඵලදායීතාවය වැඩි කිරීම සහ අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් 2023 වසරේදීද කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාවට නංවන ලදී.
- 2023 වසර තුල කුඩා පරිමාණ ගෙවතු වගාවන් ලෙස කුරුඳු , ගම්මිරිස්, ගොරකා සහ කෝපි බෝගයන් ප්‍රධාන කර ගනිමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් ආර්ථික ඵලදායීතාවයෙන් යුතු අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපිත කිරීම සඳහා අපනයන

කෘෂි බෝග පැළ ලබා දීම සිදු කරන ලදී. මෙම වැඩසටහන යටතේ ගම්මිරිස්, කුරුඳු, ගොරකා සහ කෝපි යන පැළ වර්ග 529,091 ක් ලබා දෙන ලදී. මේ සඳහා රු. මි. 15.21 ක් වැය විය.

- ප්‍රදේශයට උචිත අපනයන බෝග තම ගෙවත්ත තුල සුළු පරිමාණව වගා කිරීම සඳහා සහ විශේෂ වැඩසටහන් සහ රැස්වීම් සඳහා අවශ්‍ය අපනයන කෘෂි බෝග පැළ වර්ග ලබා දීමේ අරමුණින් යුතුව අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ කුරුඳු, ගම්මිරිස් සහ කෝපි පැළ 58,986 ක් ලබා දෙන ලදී. මේ සඳහා රු.මි.1.54 ක් වැය වූ අතර එය ඉලක්කගත මූල්‍ය ප්‍රමාණයෙන් 89.5% ක් විය.

- ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් ඒකාබද්ධ කොට පොකුරු ගම්මානයක් ලෙස පිහිටුවා ඒවායේ අපනයන කෘෂි බෝග ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව 2023 වසරේදී ද පොකුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ගොවීන් කණ්ඩායමක් ලෙස සංවිධානය කර පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවිකරණය දක්වා ක්‍රමානුකූල සැලැස්මක් යටතේ ගොවීන් සංවිධානය කර සවිබල ගැන්වීමට මෙන්ම අවශ්‍ය වෙළඳපල සම්බන්ධීකරණයට අවශ්‍ය කටයුතු කරන ලදී. මෙම පොකුරු ගම්මාන වැඩසටහන යටතේ පැහිරි , කෝපි , කරාඹු සහ කරඳමුංගු පැළ 163,546 ක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා රු. මි. 1.40 ක් වෙන් කර ඇති අතර, එම ප්‍රමාණයෙන් රු. මි. 1.14 ක් වැය විය.

- කහ සහ ඉඟුරු වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ ගොවීන් සඳහා අවශ්‍ය උපදෙස් හා තාක්ෂණික මඟ පෙන්වීම් 2023 වසර තුලදී සිදු කරන ලදී.

- අපනයනය ඉහළ නැංවීම හා වගාකරුවන්ගේ ආදායම වැඩි කිරීම මෙන්ම පාංශු හා ජල සංරක්ෂණය වැඩි දියුණු කිරීම යටතේ පරිසර සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව පුවක් වගා වැඩසටහන 2023 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පුවක් පැළ මිලියනයක ඉලක්ක ගත පැළ ප්‍රමාණයෙන් පුවක් පැළ 968,300 ක ප්‍රමාණයක් ලබා දෙන ලද අතර පුවක් ප්‍රවර්ධන වැඩසටහන සඳහා රු. මි. 25.3 ක් වැය විය.

- අපනයන කෘෂි බෝගයන්හි උසස්, ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතය වඩා වැදගත් වන අතර, 2023 වසර තුල ගොවීන් වෙත උසස් ගුණාත්මයෙන් යුතු සහතික කරන ලද පැළ අවශ්‍යතාවය දෙපාර්තමේන්තු පැළ තවාන් 12 ක් හා පෞද්ගලික පැළ තවාන් 661 ක් මඟින් සපුරා ගන්නා ලදී. 2023 වසරේදී දෙපාර්තමේන්තුව ගස්නාව පැළ තවාන ජල සම්පාදන පද්ධති පිහිටුවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලද අතර මධ්‍යම පැළ තවාන් සඳහා අවශ්‍ය ගොවිපල උපකරණ මිලට ගනු ලැබීය. 2023 වසරේදී මධ්‍යම පැළ තවාන්වල අපනයන කෘෂිබෝග පැළ 1,661,052 ක් නිෂ්පාදනය කරන ලදී. මධ්‍යම පැළ තවාන් සංවර්ධනය සඳහා 2023 වසරේදී රු. මි. 11.07 ක් වැය වූ අතර එය ඉලක්කගත මූල්‍ය ප්‍රගතියෙන් 61.5 % කි.

- අපනයන කෘෂි බෝග ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන 2023 වසරේදී ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ යහපත් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම තුලින් පවත්නා වගාවන්හි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පාළු පැළ ලබා දීම , අපනයන කෘෂි බෝග කාලගුණ විපර්යාසවලට අනුහුරු කිරීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම තුලින් පවතින අපනයන කෘෂි බෝග වගාවන් ජල හිඟ තත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ආධාර ලබා දීම මෙන්ම අපනයන බෝග වලට හානි කරන පලිබෝධ හා සත්ත්ව හානි වළක්වා ගැනීමේ අරමුණින් උපාංග හා පද්ධති හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ හෙක්ටයාර 1133.07 ක් සඳහා අපනයන කෘෂි බෝග පාළු පැළ සිටුවීම සඳහා ලබා දුන් අතර, බිංදු හා විසිරි ජල සම්පාදන පද්ධති 08 ක්, ආරක්ෂිත වැටවල් හා වගා ආරක්ෂිත පද්ධති 16 ක් ස්ථාපනය සඳහා පිරිවැයෙන් 50% ආයෝජන ආධාර ක්‍රමය යටතේ ලබා දෙන ලදි. මේ යටතේ භූමි ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන සඳහා රු.මි. 26.5 ක් හා පළිබෝධ හානි වැළැක්වීම සඳහා රු. මි. 0.979 ක් හා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති සඳහා රු. මි. 0.54 ක් වැය විය. මෙය සමස්ත මුල්‍ය ඉලක්කයෙන් 87.5% කි.
- අගය දාම සංවර්ධන වැඩසටහන යටතේ කාබනික ගම්මාන පිහිටුවීම, පසු අස්වනු තාක්ෂණ උපකරණ ලබා දීම, වෙලෙඳ ප්‍රවර්ධන වැඩසටහන් මාදුකාංග හා ඩිජිටල් පද්ධති සංවර්ධනය, තත්ව සහතික ලබා දීම, පාර්ශ්වකරුවන් ලියාපදිංචිය, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම සමස්ත වැඩසටහන සඳහා රු. මි. 35.83 ක් වැය වූ අතර එය සමස්ත මුල්‍ය ප්‍රගතියෙන් 98.1% කි.
- අපනයන කෘෂිකර්ම අගය දාම සංවර්ධන වැඩසටහන යටෙත් අපනයන කෘෂි බෝග කාබනික වගාවන් ලෙස පිහිටුවීමේ වැඩසටහන මඟින් ජාත්‍යන්තර කාබනික සහතිකය මේ වන විටත් ලබා ගෙන ඇති ගම්පහ දිවුලපිටිය කාබනික ගම්මානයේ තෙවන වසර සහතිකකරණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන එම ගොවි සංවිධානයට ලබාදෙන ලදි.
- 2023 අපනයන කෘෂිබෝග නිෂ්පාදන වල පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම තුලින් නිෂ්පාදන ගුණාත්මය ඉහල නැංවීම, අගය වැඩිකල නිෂ්පාදන සඳහා දිරිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජන ආධාර ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අපේක්ෂාවෙන් පසු අස්වනු තාක්ෂණ වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන අස්වනු සැකසීමේ නවීන තාක්ෂණික උපකරණ / යන්ත්‍රසූත්‍ර / ගොඩනැඟිලි / පහසුකම් හඳුන්වා දීම හා සැපයීමේ ක්‍රියාවලියක් මෙන්ම අපනයන බෝග වගාවන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම, දේශීය හා විදේශීය ප්‍රමිතීන්ට අනුව යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුගමනය කරමින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන්හි ගුණාත්මය වැඩිදියුණු කිරීම, අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම (Value Addition), රැකියා උත්පාදනය ඉහල නැංවීම උදෙසා ක්‍රියාත්මක වැඩසටහනකි. පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ 2023 වසරේදී පසු අස්වනු තාක්ෂණ උපකරණ 117 ක් සඳහා ආධාර ලබාදෙන ලද අතර ඒ සඳහා රු. මි. 32.571 ක් වැය වී ඇත.

- අගය දාම සංවර්ධන වැඩසටහන් යටතේ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් 03 ක් 2023 වසරේදී පවත්වන ලදී. 2023 වසරේදී මෙම වැඩසටහන සඳහා රු. මි. 1.953 ක් වැය විය.
- අපනයන කෘෂි බෝග සඳහා වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකකරණ වැඩසටහන යටතේ ලබාගැනීමට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්වලින් GAP සහතික 102 ක් ලබා දී ඇත.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ගුණාත්මය සහතික කිරීම පිණිස ආරම්භ කරන ලද තත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ISO 22000/HACCP සහතිකය සැකසුම් මධ්‍යස්ථාන දෙකකටත් ,GMP සහතිකය මධ්‍යස්ථාන තුනකටත් ලබාදෙන ලදී .තාක්ෂණික හා මූල්‍ය දායකත්වය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලදී. කාබනික සහතික, ISO සහ GMP සහතික ලබා දීමේ වැඩසටහන සඳහා රු. මි. 0.912 ක් වැය විය.
- අගයදාම සංවර්ධන වැඩසටහන යටතේ පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම මඟින් පාර්ශ්වකරුවන් 31,500 ක් ලියාපදිංචි කටයුතු සිදු කරන ලදී. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා පාර්ශ්වකරුවන් 254 ක් දෙනෙකු සඳහා සහාය ලබා දෙන අතර, ඒ සඳහා රු. මි. 0.0949 ක් වැය විය.
- අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත පාශ්වකරුවන් මෙන්ම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා සන්නිවේදන වැඩසටහන් රැසක් 2023 වසරේදි ක්‍රියාත්මක කරනු ලැබීය.

  ඒ යටෙත් ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන් . මුද්‍රිත මාධ්‍ය . තොරතුරු කේන්ද්‍රය, 1920 කෘෂි සේවා තොරතුරු , වෙබ් අඩවි, facebook, You Tube, Telegram සහ Whatsapp වැනි සමාජ මාධ්‍ය ජාලා මඟින් ද අපනයන කෘෂි බෝග තොරතුරු පාර්ශ්වකරුවන් අතර සන්නිවේදනය කරන ලදී.

- රූපවාහිනී වැඩසටහන් ලෙස සැඟවුණු කහවණු වැඩසටහන් 24 , රන්මසු උයන වැඩසටහන් 24 ක් විකාශනය කරන ලද අතර, රස ජනනී වැඩසටහන් 51, රස මංසල වැඩසටහන් 51, හරිත මංසල වැඩසටහන් 10 ක් ඇතුළු ගුවන් විදුලි වැඩසටහන් ප්‍රචාරය කරන ලද අතර අපනයන කෘෂි බෝග සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් 07 ක් පළ කරන ලදී.

- අපනයන කෘෂි බෝග වෙලෙඳපොළ මිල ගණන් පාර්ශ්වකරුවන් වෙතට ලබා දීම සඳහා දිනමිණ පුවත්පතේ මිල ගණන් තොරතුරු දැන්වීම් 52 ක් පළ කරන ලදී. අපනයන කෘෂි බෝග අත් පත්‍රිකා 115,000 ක් මුද්‍රණය කරන ලදී.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති තොරතුරු කේන්ද්‍රය මඟින් අපනයන කෘෂි බෝග පිළිබඳ තොරතුරු පුද්ගල පැමිණීම් 1,169 ක් වෙත ලබා දෙන ලද අතර දුරකථන මාර්ගය ඔස්සේ 1,277 ක් වෙත තොරතුරු ලබා දී ඇත.

  1920 කෘෂි උපදේශන සේවාව යටතේ 3,519 ක් වෙත අපනයන කෘෂිබෝග පිළිබඳ තාක්ෂණික තොරතුරු අවශ්‍ය පාර්ශ්වකරුවන් වෙත ලබා දී ඇත.

අපනයන කෘෂි බෝග පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා පුද්ගලයින් 194,650 ක් අපනයන බෝග පිලිබඳ තොරතුරු ලබා ගෙන ඇත. තවද, facebook හරහා අපනයන බෝග පිළිබඳ තොරතුරු 1,325ක්ද , සජීවී වැඩසටහන් 56 ක්ද අපනයන බෝග තොරතුරු පිළිබඳ ප්‍රතිචාර 9,882ක් වෙත ලබා දී ඇත.

You Tube Channel හරහා අපනයන කෘෂි බෝග තාක්ෂණික තොරතුරු ඇතුලත් විඩියෝ 137ක්, සජීවී වැඩසටහන් 70 ක් , ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම් 111 ක් සිදු කරන ලදී.

Telegram හා whatsapp මාර්ගයන් යටතේ පිළිවෙලින් 1,450 ක් හා 3,220 ක් වෙත අපනයන කෘෂි බෝග තාක්ෂණික හා ගැටළු පිළිබඳ ප්‍රතිචාර දැක්වීම් සිදු කර ඇත.

අපනයන කෘෂි බෝග පිළිබඳ ප්‍රදර්ශන 11 ක් 2023 වසර තුල පවත්වා අපනයන කෘෂි බෝග තාක්ෂණික දැනුම පාර්ශ්වකරුවන් වෙත ලබා දෙන ලදී. අනුව , 2023 වසරේදී සමස්ත සන්නිවේදන වැඩසටහන් සඳහා රු. මි. 13.67 ක් වැය විය.

- ධාරිතා වර්ධන වැඩසටහන යටතේ ගොවි පුහුණු, ක්ෂේත්‍ර දින, මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් , කුරුඳු පුහුණු වැඩසටහන් හා මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- අපනයන කෘෂි බෝග පිළිබඳ ගොවි පුහුණු වැඩසටහන් 1940 ක් දිස්ත්‍රික්ක 17 තුල පවත්වා ඇත. මේ සඳහා රු. මි. 2.562 ක් ද ක්ෂේත්‍ර දින වැඩසටහන් 2023 වසර තුල 216 ක් පවත්වනු ලැබූ අතර, ඒ සඳහා රු. මි. 0.04 ක් වැය විය. මෙමඟින් අපනයන කෘෂි බෝග පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී.

  අපනයන කෘෂි පාර්ශ්වකරුවන් හා දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුමෙන්, ආකල්පයෙන් හා කුසලතාවයෙන් පිරිපුන් බවට පත් කරලීමේ වගකීම දරන අපනයන කෘෂිකර්ම සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය 2023 වසර තුල සාමාන්‍ය පුහුණු වැඩමුළු හා පුහුණු වැඩසටහන් මෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ද පුහුණු වැඩසටහන් රාශියක් සාර්ථකව සම්පූර්ණ කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන් අදාළ අවශ්‍යතාවය පරිදි සිදු කරන ලදි. මාතලේ පුහුණු වැඩසටහන් සඳහා රු. මි. 0.4357 ක් වැය විය.

  තවද බාහිර ආයතන හා උසස් අධ්‍යාපන ආයතනවල ඉල්ලීම පරිදි විශේෂිත ප්‍රායෝගික පුහුණු සැසි හා වැඩසටහන් පුහුණු මධ්‍යස්ථානය තුල මෙන්ම අදාල ආයතන පරිශ්‍රවලදී ද පවත්වන ලදි. ඒ අතර කුණ්ඩසාලේ, ආදී කෘෂිකර්ම විද්‍යාල, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, ඇක්වයිනාස් ආයතනය, කාර්මික විද්‍යාල ආදිය 2023 වසරේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානයෙන් තාක්ෂණික පුහුණු ලබාගත් බාහිර සේවා ලාභී ආයතන ලෙස දැක්විය හැකිය. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ආයතනික හා තාක්ෂණික දැනුම සංවර්ධනය කිරීමේ

අරමුණෙන් සම්මන්ත්‍රණ හා ආයතනික පුහුණු වැඩසටහන් 29 ක් පුහුණුලාභීන් 1166 දෙනෙකු සඳහා ඉතා සාර්ථකව සිදු කරන ලදි.මේ සඳහා දෙපාර්තමේන්තු හා බාහිර ආයතනවල සම්පත් දායකයන්ගේ දායකත්වය ලබා ගන්නා ලදි.එමෙන්ම මෙම පුහුණු වැඩසටහන් අතර ප්‍රමුඛ වැඩසටහනක් ලෙස මුදල් අමාත්‍යාංශයේ සම්පත් දායකත්වයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් 100 දෙනෙකු සඳහා සිදු කරන ලද ITMIS වැඩසටහන දැක්විය හැකිය.

එමෙන්ම මෙම ආයතනය මගින් ඉහළ ප්‍රතිචාර යටතේ මාර්ගගත පුහුණු වැඩසටහන් මාලා 02 ක් වඩාත් විධිමත් ලෙස zoom තාක්ෂණය ඔස්සේ පවත්වමින් සජීවීව දෙපාර්තමේන්තු නිල මුහුණු පොත හා යූ ටියුබ් නාලිකා හරහා විකාශනය කරන ලදී. මෙහිදී අහඹරුවාදා අපනයන කෘෂි බෝග වගාව, නඩත්තුව හා රෝග පාලනයට අදාළ තාක්ෂණික කරුණු ඇතුලත් පුහුණු වැඩසටහන් හා බ්‍රහස්පතින්දා දිනයන්හි අපනයන කෘෂිකර්ම ව්‍යවසායකත්ව සංවර්ධන හා අපනයනය ඉලක්ක කරගත් පුහුණුවැඩසටහන් ලෙස විකාශනය කරන ලදී. ඒ අනුව 2023 වසර පුරා මාර්ගගත පුහුණු 68 ක් පවත්වා ප්‍රතිලාභීන් 305,046 දෙනෙකු බිහි කර ඇත. ඒ ලෙස අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය, 2023 වසරේ සමස්ථ පුහුණු වැඩසටහන් 97පවත්වා එමඟින් පුහුණුලාභීන් 306,212දෙනෙකු සඳහා අපනයන කෘෂි ක්ෂේත්‍රයට සම්බන්ධ තාක්ෂණික දැනුම ලබාදෙන ලදී.

කුරුඳු තැලුම්කරුවන් විධිමත් ලෙස පුහුණු කර රැකියා අවස්ථා ලබා දීමේ අරමුණින් යුතුව මාතර කුරුඳු පුහුණු මධ්‍යස්ථානයේදී 2023 වසර තුලද කුරුඳු තැලුම් පුහුණු වැඩසටහන් 91 ක් සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා රු. මි. 2.4076 ක් වැය විය.

සමස්ථයක් ලෙස ගත් කළ ධාරිතා වර්ධන වැඩසටහන සඳහා 2023 වසරේ දී රු.මි.14.16 ක් වෙන් කරන ලද අතර එයින් රු.මි.5.45 ක් වැය වී ඇත.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව ශ්‍රී ලංකා කුරුඳු බෝගය සඳහා කුරුඳු භූගෝලී දර්ශකය ලබා ගැනීමට කටයුතු කරන ලදී. එහිදී කුරුඳු භූගෝලීය දර්ශකය ලබා ගැනීම සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතාවන් සම්පූර්ණ කර අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කුරුඳු භූගෝලීය දර්ශක සහතික 45 ක් ලබා ගැනීමට හැකි විය.

- ගෝලීය වෙළෙඳපොළ සඳහා පවතින අද්විතීය කෝපි ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම තුලින් කෝපි වගාවේ තිරසාර හා ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෝපි දිනයක් පැවැත්වීමට කටයුතු යොදන ලද අතර එය 2023.10.20 දින ඇල්ල ප්‍රාදේශිය සභා ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන මඟින් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය හා දැනුම ඉහළ නැංවීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම ,සහතිකකරණය ,කෝපි සැකසුම්කරණය ,අගය දාම සංවර්ධනය,කෝපි කර්මාන්තයේ ගැටළු හා අභියෝග හඳුනාගැනීම අරමුණු කරන ලදී.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එකසත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහභාගීත්වයෙන් අපනයන කෘෂි බෝග යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙමඟින් අපනයන වෙළඳපොළ වෙත යොමු කරවීමට බලාපොරොත්තු වන අතර මේ යටතේ ොගාවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 11 ක් දිස්ත්‍රික්ක 11 පවත්වන ලදී. නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 07 ක් පවත්වන ලදී. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ භාවිත සංග්‍රහයන් සකස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර , කහ, ඉඟුරු , සාදික්කා සහ කරාඹු යන බෝග සඳහා භාවිත සංග්‍රහයන් සකස් කිරීම සඳහා මහජන අදහස් විමසා භාවිත සංග්‍රහයන් සකස් කරමින් පවති.
- 2004 වසරේ සිදුවූ සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් කුරුඳු ඉඩම් පුනරුත්ථාපනයෙන් අනතුරුව 2006 වසරේදී ආරම්භ කරන ලද නැවුම් කුරුඳු මංගල්‍යය 2023 වසරේ දෙසැම්බර් මස 23 වන දින ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ නිළධාරීන් , දෙපාර්තමේන්තු නිළධාරීන් හා කුරුඳු වගාකරුවන්ගේ සහභාගීත්වයෙන් ගාල්ල, සීනිගම දෙවොල් දේවාල භූමි පරිශ්‍රයේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදි.

දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ඵලදායිතා සහ තත්ත්ව වැඩිදියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දායක වීඇත.

කරඳමුංගු බීජ ප්‍රරෝහණ කාර්යක්ෂමතාව විනාඩි 10ක් 25 % v/v Formic Acid (HCCOH) භාවිතයෙන් අම්ල ප්‍රතිකාර මගින් වැඩිදියුණු කළහැකිය. මෙම අධ්‍යයනයේදී ෆෝමික් අම්ල ප්‍රතිකාරය මගින් සියයට 75 දක්වා ප්‍රරෝහණ ප්‍රතිශතය නංවා ගත හැකිය. මෙම ක්‍රමය යටතේ බීජ වැපිරීමෙන් දින 70 කට පමණ පසු එය 50 % ප්‍රරෝහණ මට්ටමටද ළඟාවේ. එබැවින් සාම්ප්‍රදායික නයිට්‍රික් අම්ල ප්‍රතිකාර සඳහා විකල්පයක් ලෙස මෙම ක්‍රමය සාර්ථකව නිර්දේශ කළ හැක.

කරඳමුංගු “කිරිඇල්ල” (වර්ගය: Vazukka) ප්‍රභේදය සඳහා අස්වැන්න ඇස්තමේන්තු කිරීම සම්බන්ධව විශේෂිත තොරතුරු සපයයි. ඒ අනුව ප්‍රභේදයයෙන් ලබාගත් පරිණත කරල් කිලෝග්‍රෑම් 1 කින් ප්‍රතිකාර කළ බීජ ග්‍රෑම් 181.2 ක් නිපදවිය හැකිය. මෙම ඇස්තමේන්තු අනුව, මෙම ප්‍රභේදයයෙන් අස්වනු නෙළන ලද පරිණත කරල් ග්‍රෑම්100 කින් බීජ පැල 1267 ක් නිපදවිය හැකිය.

කරඳමුංගු පැළ තවානෙන් ගලවා සිටුවීම සඳහා වඩාත් සුදුසු අවස්ථාවන් ලෙස තනි කොළයක් සහිත, අර්ධ වශයෙන් විවෘතවූ තනි කොළයක් සම්පූර්ණයෙන්ම විවෘත වූ තනි කොළයක් සහ කොළ දෙකක් කොළ තුනක් සහ අංකුරයක් සහිත බීජ පැළවේ. අධ්‍යයනයේදී සොයාගත් පරිදි එම අවධීන් වලින් ගලවා සිටුවන බීජ පැළ වලින් 80% කට වඩා සාර්ථක බීජ පැළ ලබාගත හැකිය.

2022 මහ කන්නයට සාපේක්ෂව 2023 යල කන්නයේ ගම්මිරිස් වැලකින් අස්වැන්නේ අමු බර සහ වියළි බර සැලකිය යුතු ලෙස අඩු වීම, නිරීක්ෂණය වී ඇත. කොට්ට (ග්‍රෑම් 154.3) සහ එරබදු (ග්‍රෑම් 147.6) ගස් ආධාරක ලෙස ගෙන වගා කළ ගම්මිරිස් වැල්වලින් ග්ලිරිසීඩියා (ග්‍රෑම් 66.1) සහ ගන්සූරිය (ග්‍රෑම් 90.6) ආධාරක ලෙස ගෙන වගා කළ ගම්මිරිස් වැල්වලට සාපේක්ෂව වැලක අස්වැන්නෙහි

වැඩි අමු සහ වියළි බරක් ලබා දී ඇත. එරබදු ආධාරක මත වගා කරන ලද ගම්මිරිස් වැල් වල ඉහළම සමුච්චිත අමු සහ වියලි අස්වැන්නක් නිරීක්ෂණය විය.

2023 අගෝස්තු මාසයේදී සැවැන්දරා (*Chrysopogonzizanioides*) හි රැස් කරන ලද පෛව ස්කන්ධ දත්ත සංඛ්‍යානමය විශ්ලේෂණය අනුව යූරියා 25KgHa-1, ERP 107Kg/ Ha සහ MOP 50Kg/ Ha පොහොර යෙදූ සැවැන්දරා ශාකයන් හි ඉහළ මුල්වල වියළි බරක් (76.61g), පත්‍ර බර (363.03g) ලබා දී ඇති අතර මුල් සහ පත්‍ර අමු බර අනුපාතය (0.2125) ලබාදී ඇත.

හරස් අතු මගින් හටගත් වැල්වලට සාපේක්ෂව මුදුන් රිකිලි සහ පාවැල් මගින් හටගත් ගම්මිරිස් වැල්වල වැලකට අමු බර ,වියළි බර සහ වැළකට ඇති ගම්මිරිස් කරල් ගණන සැලකිය යුතු ඉහළ අගයක් ගෙන ඇත. පාර්ශ්වීය අතු වලින් හටගත් ගම්මිරිස් වැල් 3ක් පමණක් සිරස් අතට වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වැලකින් අස්වැන්න උපරිම අමු බර සහ කරල් පිරීමේ ප්‍රතිශතය ලබා දුන්නේ පුවක් ආධාරක මත වගා කර ඇති ගම්මිරිස් වැල් වලින් වන අතර ඒවාට ජලය දිනකට ලීටර් 15 ක් ලබා දුන් අතර වැලකට වැඩිම වියළි බර ලබා දී ඇත්තේ දිනකට ලීටර් 20 ක් ලබා දුන් වැල් මඟිනි.

විවිධ වගා මාධ්‍යවලදී S9 සහ ලක්පැරකුම් යන ඇරබිකා කෝපි ප්‍රභේදවල (S9 සහ Lak-Parakum) දඬු කැබලි වල වර්ධනය සහ මුල් හටගැනීමේ හැකියාව පරීක්ෂා කරන ලදී. බදුන් මාධ්‍ය ලෙස කොහු බත්: මතුපිට පස් (2:1) සහ මතුපිට පස්: වැලි: කොහු බත්: ගොම (1:1:1:1) භාවිතා කරන ලදි. මේ මාධ්‍ය දෙකම භාවිතයෙන් S9 සහ ලක්-පැරකුම් කෝපි වර්ග වල කඳ කැබලි (65% සාර්ථක) භාවිත කර කෝපි පැළ නිෂ්පාදනය කිරීමට නිර්දේශ කළ හැකිය.

විවිධ බද්ධ කිරීම් කලම්ප සහිත ඇරබිකා කෝපි සහ රොබස්ටා කෝපි බද්ධ සංගතිය සහ තවාන් කාර්ය සාධනය පරීක්ෂා කරන ලදී. මෙමගින් තවාන් අවධියේදී බද්ධ කරන ලද කෝපි පැළවල වර්ධනය පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සපයයි. ඒ අනුව, ඇරබිකා වර්ග දෙකම බද්ධ කිරීම වඩා සුදුසුය. ලක්පැරකුම් සහ S9 වලට රොබස්ටා කෝපි ග්‍රාහක කඳ කොටස් සුදුසු වන අතර එය වඩාත් ලාභදායී බද්ධ කිරීමේ ක්‍රමයකි.

කෙසේ වෙතත්, කඳ සහ මුල් නැවුම් බර සහ මුල් වියළි බර වැනි වර්ධන පරාමිතීන් සම්බන්ධයෙන් ලක්-පැරකුම් S9 වලට වඩා හොඳින් ක්‍රියා කළේය. බද්ධ කරන ස්ථාන වැසෙන පරිදි එතීම සඳහා එතීමේ ද්‍රව්‍යයක් ලෙස සාමාන්‍යයෙන් භාවිතා කරන පොලිතීන් වියදම අධික ද්‍රව්‍යක් වන අතර ආහාර දවටන (Lunch sheet) වඩා හොඳ විකල්ප වඩාත් ලාභදායී එතීමේ ද්‍රව්‍යයක් ලෙස සැලකිය හැකිය.

All spice යනු ශ්‍රී ලංකාව සඳහා නව බෝගයකි. කෙසේ වෙතත්, දුර්වල ප්‍රචාරණය හේතුවෙන් රෝපණ ද්‍රව්‍යය සැපයීම ගැටළුවකි. මෙම ගැටළුව විසඳීම සඳහා Allspice (*Pimentadioica* L. Merrill) නාලස්ථ ප්‍රචාරණ Allspice (*Pimentadioica* L. Merrill) ක්‍රමවේදය යොදාගත හැකිය. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ Allspice හි ගැට සහිත කඳ කැබළි යොදා නාලස්ථ ප්‍රචාරණය සඳහා

කාර්යක්ෂම ප්‍රොටෝකෝලයක් සොයා ගැනිමයි. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ ක්ෂේත්‍රවල නිරෝගී ශාකවලින් ලබාගත් ගැට සහිත කඳ කැබළි කොටස් දහඅයෙන් තොරව Allspice කැලස ලබාගැනීම සඳහා ප්‍රශස්ත ක්‍රියාපටිපාටිය හඳුනාගැනීම සඳහා භාවිතා කරන ලදී. විටමින්, මයෝ-ඉනොසිටෝල් සහ සුක්‍රෝස් සමඟ අතිරේකව MS මාධ්‍ය මත ගැට සහිත කඳ කැබළි කොටස් ස්ථාපිත කරන ලදී. අධ්‍යයනයයෙන් පසුව, 0.1% Carbendazim (පැය1) , 2% $HgCl_2$ (මිනිත්තු 6) ප්‍රතිකර්ම 2 ක සති දෙකකට පසු හොඳම ප්‍රතිඵල (4.66±1.24) ලබාදෙයි. මෙම සොයාගැනීම පටක රෝපණ ක්‍රියාවලිය ප්‍රශස්ථ කිරීමට යොදා ගත හැකිය.

මධ්‍යම පළාතේ ගම්මිරිස් (*Piper nigrum*) වගාකරුවන් 100 දෙනෙකු සමඟ සිදු කරන ලද ශාක පෝෂක ඌනතා ලක්ෂණ පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයකින් හෙළි වූයේ අධ්‍යයනය කරන ලද ඉඩම්වලින් 94% ක පමණ වාර්තා වී ඇත්තේ වඩාත් සුලභ ඌනතා රෝග ලක්ෂණය වන අන්තර් නාරටි හරිතක්ෂය බවයි. පසුව එය සම්මත රසායනාගාර විශ්ලේෂණයකින් මැග්නීසියම් ඌනතාවය බවට තහවුරු විය.

මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල තෝරාගත් කරාබු (*Syzygium aromaticum*) වගාවන් වල සිදු කරන ලද සමීක්ෂණයකින් හෙළි වූයේ අධ්‍යනය කළ කරාබු ශාක සියල්ලම පාහේ පසේ පෝෂක ලබාගැනීමට උදව්වන දිලීරක මුල (Arbuscular mycorrhiza) මගින් ආසාදනය වී ඇති බවයි. කරාබු ක්ෂේත්‍රවල පසෙහි එම බීජාණු ඝනත්වය, පස් කිලෝවක 120-1040 පමණ පරාසයක පැවතිණි. අධ්‍යයනය කරන ලද කරාබු ක්ෂේත්‍රවලින් 40 % ක් පමණ 30% වැඩි බෑවුමකින් යුක්ත වූ අතර එම ක්ෂේත්‍රවලින් 70% ක් පමණ සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම යොදා නිබුණි. එහෙත් ඔවුන් කිසිදු රසායනික හෝ කාබනික පොහොර වර්ගයක් භාවිතා කර නොතිබුණි. අධ්‍යයනය කරන ලද කරාබු ක්ෂේත්‍රවලින් වැඩි ප්‍රමාණයක, භාවිතයට ගත හැකි පාංශු පොස්පරස් (<15 ppm) ප්‍රමාණය ඉතා අඩු වූ අතර, මධ්‍යස්ථ පාංශු සම්පූර්ණ නයිට්‍රජන් (0.1-0.2 %), ඉහළ හුවමාරු කළ හැකි පොටෑසියම් (103-426 ppm) සහ මධ්‍යස්ථ පාංශු කාබනික ද්‍රව්‍ය (1-2 %) ප්‍රමාණවලින් යුක්ත විය .

ගිනිසිරියා (*Gliricidiasepium* l.) - කළු ගම්මිරිස් ආධාරක ගසෙහි වාර්තා වී ඇති රෝග තත්ත්වය පිළිබඳ අධ්‍යනයේ ප්‍රතිඵල හරහා ගම්මිරිස් ගොවීන්ට අවශ්‍ය තොරතුරු ලබාදෙයි. අදාළ රෝග තත්ත්වය හඳුනාගෙන ගම්මිරිස් වගාවේ ආධාරක ගස් නිවැරදිව කප්පාදු කිරීමෙන් රෝගය සාර්ථකව පාලනය කළ හැකි බව තහවුරු විය.

අම්පාර ප්‍රදේශයේ කහවල කොළ පැල්ලම් රෝගය (Taphrina maculans Butler) දැවෙන ගැටලුවක් ලෙස වාර්තාවේ. මෙම තත්ත්වය මත, කහවල කොළ පැල්ලම් රෝගයට (Taphrina maculans Butler) එරෙහිව දිලීර නාශක ඇගයීම ඉතා වැදගත් වේ. Mancozeb 80 % WP (30g/10 l ජලය) හෝ Captan 50% (30g/10 l ජලය) සමඟ බීජ ජීවාණුහරණය කිරීම සහ 1% Bordeaux මිශ්‍රණය හෝ Mancozeb 80 % WP (38g/10 l ජලය) සමඟ පත්‍ර ජීවාණුහරණය කිරීම නිර්දේශ කෙරේ. ක්ෂේත්‍ර

සිටුවීමෙන් පසු දින 45 ක් (2 වතාවක් 2 සති පරතරය) සහ දින 90 (2 වතාවක් සති 2 ක පරතරයක්) මෙම ද්‍රව්‍ය යෙදීමෙන් කහවල කොළ පැල්ලම් රෝගය වලක්වා ගත හැකිය.

අපනයන කෘෂි කාර්මික භෝගවල පත්‍ර රෝග පාලනය කිරීම සඳහා තෝරාගත් ශාකසාර යෙදීම සඳහා හරිත කෘෂි කර්මාන්තය ප්‍රගුණ කිරීමේ රජයේ ප්‍රතිපත්ති අනුව කාබනික විසඳුමක් ලෙස මෙහිදී ශාකසාරය ලබාගැනීම සඳහා තුල්සි (*Ocimumtenuiflorum*), ගඳපාන (*Lantana camara*) සහ වල්සූරියකාන්ත (*Tithoniadiversifolia*) තෝරාගන්නා ලදී. ඉහුරු බෝගයේ පත්‍ර වල රෝගය පාලනය කිරීම සඳහා ඉහත ශාක සාරය සාර්ථකව භාවිතා කළ හැකි බව පර්යේෂණාත්මකව තහවුරු විය.

ආහාර රස ගන්වන ප්‍රධාන රසකාරකයක් මෙන්ම ඖෂධීය ගුණයෙන් යුක්ත වන සාදික්කා ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග අතරින් එකක් වේ. සාදික්කා සහ සාදික්කා ආශ්‍රිත නිෂ්පාදනවල aflatoxin නම් විසකාරකය හමුවීම එය අපනයනයේදී මුහුණදෙන ප්‍රධාන අභියෝගය වේ. සාදික්කා මත වැඩෙන පුස් වර්ග මගින් මෙම විෂකාරකය නිෂ්පාදනය කරයි.මේවා විෂ පිළිකාකාරක වන අතර අක්මාවටද හානි සිදු කළ හැකිය. එබැවින් සාදික්කා වල පුස් වර්ධනය වීම අවම කල හැකි, පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද හදුන්වා දීම ඉතාමත් වැදගත් කර්තව්‍යයක් වේ.මෙම අධ්‍යයනය මගින්, සාදික්කා වල පුස් වර්ධනය වීම මාස 06 ක් දක්වා අවම කිරීම සඳහා පහත සඳහන් නිර්දේශ ලබා දී ඇත. එනම් ,

- සාදික්කා ඵල විවෘත වීමට පෙර අස්වැන්න නෙලා ගැනීම. (පිපිරීමට කලින්)
- සාදික්කා බීජ සඳහා උණු වතුර ප්‍රතිකාරය සිදු කිරීම. (80 ^{o}C උෂ්ණත්වයේ විනාඩි 03 ක් පමණ)
- සාදික්කා බීජ, 55 ^{o}C උෂ්ණත්වයේ කැබිනෙට්ටු ආකාරයේ වියළන යන්ත්‍රයක පැය 24 ක් වියළීම.
- Laminated aluminum foil ආස්ථරයක් සහිත බෑගයක ඇසිරීම.

අමු පුවක් සඳහා ශ්‍රී ලංකා වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් අමු පුවක් නැවුම්ව කල් තබාගැනීමට සරල ක්‍රමවේදයක් හඳුන්වාදීම කාලීනව වැදගත් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව කාමර තත්ත්වයන් තුළ මේ සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය වන්නේ අමු පුවක් ෆැරනින් ද්‍රාවණ වල ගිල්වීමෙන් පසු ෆැරනින් දවටනය සමඟ පොලිතින් බෑග්වල ගබඩා කිරීමය. මෙම ක්‍රමය වඩාත් ලාභදායක ක්‍රමවේදය වන අතර මාස 2 ක් පමණ කාලයක් පුවක් නැවුම්ව තබාගත හැකිය. තවද 4-16 සෙල්සියස් උෂ්ණත්වයේ ශීත කාමර තුළ ගබඩා කිරීමෙන් මාස 5 ක් පමණ කාලයක්ද, අධි ශීතකරණ තත්ත්ව යටතේ මාස 9 ක පමණ කාලයක් ද පුවක් නැවුම්ව ලෙල්ලෙහි වර්ණය වෙනස්වීමකින් තොරව ගබඩා කර තබාගත හැක.

කෝපි අගය එකතු කළ නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සඳහා කෝපි නිෂ්පාදකයින්ගේ ඉල්ලුමක් ඇත. මෙම සංකල්පය මත, විසිර වියලීමේ තාක්ෂණය මගින් කුරුඳු රසැති ක්ෂණික කෝපි නිපදවීම සහ භෞතික රසායනික ගුණාංග ඇගයීම ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල පහත

ආකාර වේ. ක්ෂණික කෝපි වලට ක්ෂුද්‍ර කැප්සියුලේටඩ් කුරුඳු කුඩු එකතු කිරීම එහි සංවේදී ගුණාංග සහ පාරිභෝගික පිළිගැනීම සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත. ක්ෂුද්‍ර කැප්සුලේටඩ් කුරුඳු කුඩු භාවිතයෙන්, මෙම පර්යේෂණය කෝපි කර්මාන්තයට යහපත් අනාගතයක් සමඟින් ශ්‍රී ලංකාවේ කෝපි නිෂ්පාදනවල වෙළඳපල වටිනාකම ඉහළ නැංවීම සඳහා නව අවස්ථා නිර්මාණය කරයි.

Nano curcumin යනු අලුතින් හඳුන්වා දුන් අගය එකතු කළ නිෂ්පාදනයක් වන අතර එය වෙළඳපොළට හඳුන්වා දීමට පෙර එය තව දුරටත් වැඩි දියුණු කිරීම සිදු කල යුතු වේ. මෙහිදී, භෞතික-රසායනික ස්ථායීතාවය සහ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා වියළා ගත් කහ වලින් නැනෝ-කර්කියුමින් සංශ්ලේෂණය අධ්‍යයනය කර meso-porusZnO නැනෝ අංශු සමඟ encapsulated nano curcumin සොයා ගන්නා ලදී. සෝල්-ජෙල් ක්‍රමයක් භාවිතයෙන් සංශ්ලේෂණය සාර්ථක වූ අතර නැනෝ සංයුක්තය සාර්ථකව සංස්ලේෂණය කරන ලදී.

Curcumin සතුව ප්‍රති බැක්ටීරියා ගුණ ඇත. මෙම හේතුව නිසා, නැනෝ කර්කියුමින් වෙළඳපොළට හඳුන්වාදීමට පෙර නැනෝ කර්කියුමින්හි ප්‍රති බැක්ටීරියා ගුණය ස්වභාවික කර්කියුමින් සමඟ සංසන්දනය කිරීම අවශ්‍ය වේ. *E.coli* සහ *S.aureus* ට එරෙහිව ප්‍රති බැක්ටීරියා අධ්‍යයනය සිදුකරන ලද අතර සාම්පල වල ප්‍රති බැක්ටීරියා ක්‍රියාකාරකම් සංසන්දනය කරන ලදී. ඒ අනුව, ග්‍රෑම් - සෘණ සහ ග්‍රෑම් - ධන බැක්ටීරියා යන දෙකටම එරෙහිව නැනෝ - කර්කියුමින් තුළ වඩා හොඳ සාර්ථකත්වයක් ලබාගන්නා ලදී.

කොකෝවා ප්‍රධාන වශයෙන් චොකලට් සහ රසකැවිලි කර්මාන්ත සඳහා යොදාගනී. කෙසේ වෙතත්, කොකෝවා බටර් ස්වභාවික අමුද්‍රව්‍යයක් ලෙස රූපලාවණ්‍ය කර්මාන්තයේ භාවිතා වේ. මෙම විශේෂිත පර්යේෂණයේදී කොකෝවා බටර් නිස්සාරණය කර ඇති අතර, තොල් ආලේපනය සකස්කිරීම සඳහා එම බටර් සමඟ වර්ජින් පොල්තෙල්, ආමන්ඩ් තෙල් සහ ඔලිව්තෙල් යොදාගනිමින් විවිධ සංයුති භාවිතා කරන ලදී. තොල් ආලේපන සාම්පල සඳහා සංවේදී විශ්ලේෂණය සහ භෞතික රසායනික විශ්ලේෂණය සිදුකරන ලදී.

අයහපත් කාලගුණික තත්ත්වයන්ට කුරුඳු වගාවට ජලය සම්පාදනය ඉතා ප්‍රයෝජනවත් විසඳුමකි. විසිරි ජල සම්පාදන පද්ධතියක් භාවිතයෙන් අස්වනු නෙළාගතහැකි කඳන් සංඛ්‍යාව, පොත්ත ඝණකම, කඳේ උස, නැවුම් පොත්ත බර සහ වියළි පොත්ත බර වැනි වර්ධන සහ අස්වනු පරාමිතීන් වැඩිකරගත හැක. විසිරි ජල සම්පාදන පද්ධතිය හිතකර ක්ෂුද්‍ර දේශගුණික තත්ත්වයක් නිර්මාණය කළද, බිංදු ජලසම්පාදන ක්‍රමය මඟින් ශාක වියනෙහි ස්වභාවය අනුව විසිරි ජලසම්පාදන ක්‍රමයට වඩා හොඳ බෙදාහැරීමේ ඒකාකාරී බවක් පෙන්නුම් කරයි.

කුරුඳුවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා කුරුඳු ඉඩම්වල පාංශු බාදනය පාලනය කිරීම අවශ්‍ය වේ.මෙම තත්ත්වය හේතුවෙන් කුරුඳු ඉඩම්වල පාංශු බාදනය පාලනය සඳහා තෝරාගත් කෘෂි විද්‍යාත්මක භාවිතයන් ඇගයීමට ලක් කරන ලදී. ප්‍රශස්ත පාංශු ගුණ සහිතව, ආවරණය බෝග (*Arichispintoi*) සහ සමෝච්ඡ පාංශු බැම්ම ප්‍රතිකාරයන් පාංශු බාදනය අවම කොට ඇත අතර,පාංශු

බාදන පාලන ක්‍රමයක් නොමැති ප්‍රතිකාරය ඉහළම පාංශු බාදනය පෙන්නුම් කරන ලදී. ප්‍රතිකාරයෙදී මෙන් මාස තුනකට පසු, අස්වනු නෙලීමේදීත් කිසිදු ප්‍රතිකාරයක සංඛ්‍යානමය ලෙස සැලකිය යුතු වෙනසක් නොපෙන්වයි. කෙසේ වෙතත්, වර්ධනය සහ අස්වැන්න සමෝච්ඡ පාංශු බැම්ම සහ ආවරණ බෝග (*Arichispintoi*) ප්‍රතිකාරවල ඉහළ අගයන් පෙන්නුම් කර ඇත.

මව් පඳුරු වල අග්‍ර අංකුර ඉවත් කිරීම කුරුඳුවල වර්ධක ප්‍රචාරණයේ සාර්ථකත්වයට බලපාන නමුත් වර්ධන පරාමිතීන් කෙරෙහි බලපෑමක් නැත. සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු නොවුනත්, සිටුවීමට සති 2 කට පෙර අග්‍ර අංකුරය ඉවත් කිරීමේ ප්‍රතිකාරයෙන්, වැඩිම නොමැරී ඉතිරි වූ සහ අංකුර ඇදුනු දඩු කැබලි ප්‍රමාණයක් නිපදවා ඇත.

පළමු බහු ස්ථානීය අත්හදා බැලීම් දෙක NCRTC සහ මිද්දෙනිය ගොවිපලෙහි ස්ථාපිත කරන ලදී. NCRTC හි පිහිටුවීමේ සාර්ථකත්වය 100% සහ මිද්දෙනිය 80% වේ. වර්ධන පරාමිතීන් තුළ මෙතෙක් සැලකිය යුතු වෙනස්කම් සොයාගත නොහැකි විය. පර්යේෂණය සිදුවෙමින් පවතී.

ප්‍රතිඵල අනුව, රූප විද්‍යාත්මක ලක්ෂණ කඳේ සෘජු බව, වියනේ විෂ්කම්භය සහ කඳේ ඇති පුරුක් ගණන මඟින්, අවසාන පොතු අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කොට ඇත. මනින ලද පරාමිතීන් අනුව සැලකිය යුතු වෙනස්කම් ඇති පොකුරු තුනක් හඳුනාගෙන ඇත. උසස් රූප විද්‍යාත්මක ලක්ෂණ සහිත පොකුර කුරුඳු ප්‍රබේද වැඩිදියුණු කිරීමේ අනාගත වැඩසටහන් සඳහා යොදා ගැනීමට ඉහළ විභවයක් ඇත.

සුළහ පළිබෝධකයකු ලෙස *Thalassodesimmissaria* ගේ රූප විද්‍යාත්මක හඳුනාගැනීම සහ ජීවන චක්‍රය විස්තර කිරීමත්, හානිය ඇගයීමත් මෙම පර්යේෂණයේ අරමුණ විය. ජීවන චක්‍රය තුළ සම්පූර්ණ පටක හානිය වර්ග සෙ.මී. 36.7 ක් විය. ගැහැණු සුහුඹුලා මි.මී. 0.5 - 0.75 ප්‍රමාණයේ ලා කොළ පැහැති සිළින්ඩරාකාර බිත්තර 35 – 40 ක් වරකට දමයි. කීටයා, පැය 96 ක් තුළ සෙ.මී 1.4 සිට සෙ.මී. 3.36 දක්වා දිග වැඩි කර ගනී. අටවන දින කෝෂගතවීම ඇරඹේ. කීටයා කැපී පෙනෙන වර්ණ තුනක් දක්වයි. කීටයාගේ හිස දෙබෙදුම්ය. උදරීය ඛණ්ඩ 7 – 8 මත වක්‍රීයව සකස්වූ Biordinal වර්ගයේ ව්‍යාජ පාද පවතී. Bipectinate ස්පර්ෂක පිරිමි සුහුඹුලාටද සූත්‍රිකාකාර ස්පර්ෂක ගැහැණු සතාටද පවතී. සුහුඹුල් ගැහැණු සතාගේ දිග සෙ.මී. 1.3 කි. පිරිමි සතා සෙ.මී. 1.4කි. පූර්ව සහ අපර පියාපත් වල පරාසයන් පිළිවෙලින් සෙ.මී. 3.5 ක් සහ 1.8 ක් වේ. ගැහැණු labial palp වල තෙවන ඛණ්ඩකය වඩාත් දිගය. පිරිමි සළඹයාගේ අපර tibia කොටස දිගටි සහ රෝමවලින් ආවරණිතය. සරල ඇස් විරහිතය. ගැහැණු සතාට පියාපත් එකට බැඳ තබන යාන්ත්‍රණයක් නොමැත. අපර පියාපතෙහි අතු බෙදී නැත. මෞඛ කොටස් දිගැහි ශෘණ්ඩාවක ස්වරූපය ගනී. අපර පියාපතෙහි ඩිස්කල් කුටීරය පසුපසින් එක් අපරවාහිනියක් පමණක් ඇත. පූර්ව පියාපත ආරම්භ වන තැන fovea නැත. උත්තර උදරීය ලොම් ආවරණය නැත. පිරිමි ජනනේන්ද්‍රිය දිගැහි ජීවිභාකාර harpe කොටසකින් සමන්විත අතර, එය මෙම විශේෂය අනෙක් මෙම ගණයේ විශේෂවලින් වෙන්කර ගැනීමට උපකාරී ලක්ෂණයකි.

කොළ වල ගැටිති සාදන පැළමැක්කා, ඉන්දියාවේ සහ ලංකාවේ ගම්මිරිස් (*Piper nigrum*) වල ප්‍රධාන පළිබෝධකයෙක් ලෙස ගැනේ. කෙසේ වෙතත්, මෙම කෘමියාගේ ජීව විද්‍යාත්මක නාමය විවාදිතය. එබැවින් මෙම ගම්මිරිස් පැළ මැක්කා රූප විද්‍යාත්මකව කීට විද්‍යානාමකරණ ක්‍රම හරහා නිවැරදිව හඳුනාගෙන නාමකරණය සිදුකිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. උඩු හනුවේ bridge එක නොමැත. සංකීර්ණ ඇස්වල අපර මායිමට ආසන්න වනතෙක් උඩු හනුවේ stylets විහිදයයි. පූර්වෝදරීය උත්තර කබොල මත මනාව වෙන්කර හඳුනාගත හැකි දැඩි කෙඳි යුගල 5කි. උච්ඡර්මීය රටා අපහැදිලිය. පූර්ව පාද කූර්චදන්තය දෙවර්ගයේම නැත. ස්පර්ෂක ඛන්ඩ 7 ,8, 5 සහ 6 සමවම ඒකාකාර ලෙස අව පැහැගෙන ඇත. මේ අනුව ප්‍රීස්නර් විසින් 1968 දී කර ඇති අපහැදිලි මූලික විස්තර කිරීම නැවත තහවුරු කරමින්, ලංකාවේ ගම්මිරිස් පත්‍ර ගැටිති සාදන පැළමැක්කා *Liothrips mirabilis* ලෙස කීට විද්‍යාත්මකව හඳුනාගෙන තහවුරු කරන ලදී.

රෝස කඳ පණු ආසාදනය වැලැක්වීම, වර්ධනය වූ කුරුඳු පාදම වටා, අවම වශයෙන් සෙ.මී. 2.5 ක ඝණකම සහිත මැටි පදනම් වූ ආවරණයක් ආලේප කළ හැකි බව පෙන්වා දෙන ලදී. මෙය, දැනට පවතින නිර්දේශය වනපාදම පස්වලින් ආවරණය කිරීම ප්‍රායෝගිකව ප්‍රමානවත් මට්ටමෙන් කළ නොහැකි බැවුම් ඉඩම් සඳහා අතිරේක වශයෙන් සිදුකළ හැකි ප්‍රතිකර්මයකි.

මෙහිදී, කුරුඳු පත්‍ර කණින්නාගේ (*Acrocercops*spp) හානිය මඟින් කොළ තෙල් ප්‍රතිශතය කෙරෙහි ඇතිවන බලපෑම අධ්‍යයනය කරන ලදී. කුරුඳු පත්‍ර, විශාලත්වය සහ හානියේ මට්ටම අනුව වර්ගීකරණය කර, ඒවායේ තෙල් ප්‍රමාණය, තෙල් වල ගුණාත්මකභාවය, ජල ප්‍රතිශතය, සහ තෙල්වල ගුණාත්මකභාවය සම්මත ක්‍රම මඟින් පරීක්ෂා කරන ලදී. මෙහිදී, තෙල් ප්‍රතිශතය සහ හානිය අතර ඍජු සම්බන්ධයක් ඇති බව පෙනී ගියේය. අධික හානියක් සහිත පත්‍රවල සැලකිය යුතු තෙල් අඩුවීමක් නිරීක්ෂණය වූයෙන්, කුරුඳු තෙල් නිස්සාරණයේදී පත්‍ර කණින්නාගේ හානිය කළමණාකරණය කිරීමේ අවශ්‍යතාව තහවුරු විය.

මෙම අධ්‍යයනයයේ දී, කුරුඳු වල සුදුමූල් රෝග ඇති කරන *Rigidoporusmicroporus*(fr.) overeem දිලීරයට එරෙහිව ජෛව පාලන කාරක ලෙස *Trichoderma* දිලීරය යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විද්‍යාගාර තත්ත්ව යටතේ විමර්ශනය කරන ලදී. වෙන් කර ගනු ලැබූ *Trichoderma* දිලීර හුදකලා 8 ක් පලිබෝධක දිලීරයට එරෙහිව කෘතීම පෝෂක මාධ්‍ය වල වර්ධනය කොට ඒවායේ ප්‍රතිවිරෝධතා විභවය සඳහා පරීක්ෂා කරන ලදී. මෙහිදී කුරුඳු මූලගෝලයෙන් වෙන් කරගත් එක් *Trichoderma* දිලීරකයක් (MA1), පලිබෝධක දිලීරයෙහි (*R. microporus*) අරීය වර්ධනය 44.12% කින් නිෂේධනය කරමින් ඉහළ ප්‍රතිවිරෝධක විභවයක් පෙන්නුම් කළේය. *Trichoderma* හුදකලා 8 අතුරින්, කුරුඳු මූල ගෝලය ආශ්‍රිත පසෙන් වෙන්කරගත් තවත් හුදකලා 3ක් *R.microporus* වලට එරෙහිව ඉහළ ප්‍රතිවිරෝධතා විභවයක් පෙන්නුම් කළේය.

මාතර දිස්ත්‍රික්කයේ කුරුඳු පැල තවාන් වල පත්‍ර අංගමාරය ආසාදනය වූ කුරුඳු පත්‍ර වලින් වෙන්කර ගත් *Colletotrichum* දිලීර හුදකලා 10 ක් අතරින් තෝරාගත් ප්‍රචණ්ඩ *Colletotrichum* හුදකලා

තුනකට එරෙහිව ටෙබුකොනසෝල් සහ මැන්කොසෙබ් යන දිලීර නාශකවල පලිබෝධකයා මර්ධනය කිරීමේ කාර්යක්ෂමතාවය අගයන ලදි. පර්යේෂණාගාර තත්ත්ව යටතේ කෘතීම පෝෂණ මාධ්‍යයක සිදු කරන ලද මෙම පර්යේෂණයේදී ටෙබුකොනසෝල් සහ මැන්කොසෙබ් දිලීර නාශකවල අවම නිෂේධන සාන්ද්‍රණ පිළිවෙලින් 150 ppm සහ 1500 ppm ලෙස හඳුනා ගැනිණි.

කුරුඳු තවාන් වල පැළ මැක්කන් (*Helionothripsannosus* Wang) මර්ධනය කිරීම සඳහා වියලූ කොහොඹ ඇට වලින් සාදා ගන්නා කොහොඹ ඇට නිස්සාරකය වඩාත් කාර්යක්ෂම ලෙස සකස් කරගත හැකි ක්‍රම වේදය, දැනට ප්‍රචලිත ක්‍රම වේද 04ක් අතුරින් තෝරා ගැනීම සහ එම නිස්සාරක තනුක කිරීමට සුදුසු අනුපාත පිලිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. ඇගයීමට ලක්කරන ලද ක්‍රමවේදයන් වන්නේ: වියළි කොහොඹ ඇට කුඩු ග්‍රෑම් 100 ක් ජලය ලීටර් 1 ක එක් රැයක් පොඟවා ගැනීම, වියළි කොහොඹ බීජ කුඩු ග්‍රෑම් 100 ක් ජලය ලීටර් 1 ක දින3ක් පොඟවා ගැනීම (ක්ෂුද්‍ර ජීවී පැසවීම), වියළි කොහොඹ බීජ කුඩු ග්‍රෑම් 100 ක් නටන ජලය ලීටර් 1 ක විනාඩි 30 ක් තම්බා ගැනීම, සහ වියළි කොහොඹ ඇට කුඩු ග්‍රෑම් 100 ක් පොල්තෙල් මිලි ලීටර් 500 ක විනාඩි 30 ක් තම්බාගැනීමයි. පර්යේෂණාගාර සහ ක්ෂේත්‍රගත පර්යේෂණ වල ප්‍රතිඵල වලට අනුව,නිස්සාරණය කිරීමේ ක්‍රම හතර අතුරින් පැසවීමේ ක්‍රියාවලිය හරහා සකස් කරන ලද කොහොඹ ඇට නිස්සාරකය (වියළි කොහොඹ ඇට කුඩු ග්‍රෑම් 100 ක් ජලය ලීටර් 1ක දින 3 ක් ගිල්වා තැබීම) මගින් කුරුඳු පැළ මැක්කන් පාලනය කිරීමේ හොඳම ප්‍රතිඵල වාර්තා වුණි.

කුරුඳු සඳහා නයිට්‍රජන් පොහොර ලෙස ඇමෝනියම් සල්ෆේට් (SA) 675 kg/ha/yr සමඟ යූරියා (U) 139kg/ha/ yr යෙදීමෙන්, ඇමෝනියම් සල්ෆේට් 976 kg/ha/ yr / පමණක් යෙදීමට වඩා 15% ක වැඩි වියළි පොතු අස්වැන්නක් ද යූරියා 450 kg/ha/yr පමණක් යෙදීමට වඩා 1% වැඩි වියළි පොතු අස්වැන්නක් ද පස්වන අස්වැන්නේදී ලබා දෙයි. එහිදී සමාන ප්‍රමාණ වලින් නයිට්‍රජන් (වසරකට හෙක්ටයාර් 207 kg ක්) ලබා දීම සිදුකරන ලදී. කෙසේ වෙතත්, වසර පහක සමුච්චිත මුළු වියළි පොතු අස්වැන්න සලකා බලන විට යූරියා සහ ඇමෝනියම් සල්ෆේට් (U-139 + SA- 675) ඒකාබද්ධ භාවිතයේ අස්වැන්න වැඩිවීම ඇමෝනියම් සල්ෆේට් හෝ යූරියා තනිව යෙදීමෙන් ලබාගත් අස්වැන්නට වඩා පිළිවෙලින් 4 % සහ 5% ක ප්‍රමාණයෙන් වැඩිවී ඇත.

කුරුඳු ශාකය මගින් සිව්වන අස්වැන්නෙන් වැඩිම වියළි පොතු අස්වැන්නක් ලබාදුන්නේ දෙපාර්තමේන්තු පොහොර නිර්දේශයෙන් අඩක් සමඟ කොම්පෝස්ට් වසරකට හෙක්ටයාරයකට ටොන් 10 ක් යොදන ලද කොටසේ වන අතර එය N : P : K ; 21:07:14 ක් වූ යාරා සංයෝග පොහොර 700 kg/ha/yr ක් හෝ N : P : K: Mg ; 18:8:12:2 මිශ්‍ර පොහොර 1250 kg/ha යොදන ලද කුරුඳු අස්වැන්නට වඩා සැලකිය යුතු ලෙස වෙනස් නොවීය.

සිටුවීමෙන් වසරකට පසු කුරුඳු පඳුරකට කුකුළු පොහොර කිලෝග්‍රෑම් 1000 ක් යෙදීමේදී සහ දෙපාර්තමේන්තුව නිර්දේශිත රසායනික පොහොර මාත්‍රාව යෙදීමේදී පිළිවෙලින් 24% සහ 12% පැළ

උස වැඩිවීමක්, පොහොර යෙදීමකින් තොරව වර්ධනය වූ කුරුඳු පඳුරුවල උසට සාපේක්ෂව දැකිය හැකිය.

ගැඩවිල් පණුවන්ට ආහාර ද්‍රව්‍ය ලෙස කෙසෙල් කඳ යොදාගත් විට මාස හතරකට පසු ගැඩවිල් ගහනය 200 සිට 800 දක්වා වැඩිවිය. කෙසේ වෙතත්, ආහාර ද්‍රව්‍ය කුරුඳු කොළ පමණක් නම්, ගැඩවිල් ගහනයෙන් 200 ක් 120 දක්වාඅඩුවිය. ගැඩවිල් ආහාර ලෙස ග්ලිඩිසිරිය භාවිතා කර සකස් කළ ගැඩවිල් දියර පොහොර කුරුඳු පැලවලට යෙදීම මගින් ගැඩවිල් ආහාර ලෙස තණකොළ, ගොම, කුරුඳුකොළ, කෙසෙල් කඳ භාවිතා කිරීමට වඩා සැලකිය යුතු ඉහළ වර්ධනයක් ලබාදෙයි.

පස්වන අස්වනු නෙලීමේදී, කුමන වර්ගයක (සාමාන්‍ය, ශ්‍රීවිජය, ශ්‍රීගැමුණු) කුරුඳු පැළයක් වුවද ශාකයේ අතු කැබලි මගින් ප්‍රචාරණය කරන ලද ශාකයට වඩා සැලකිය යුතු ඉහළ අස්වැන්නක් බිජ පැල මගින් ලබාදෙයි. පොහොර මට්ටම් සහ කුරුඳු වර්ග පස්වැනි අස්වැන්නෙන් සැලකිය යුතු වෙනස්කමක් සහිත ප්‍රතිඵලයක් ලබාදුන්නේ නැත.

පස්වන අස්වැන්නේදී N, P, K අනුපාත වෙනස් කිරීමේදී කුරුඳු වියළි පොත්ත අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නොමැති බව අනාවරණය විය.

කුරුඳු පොතු තෙල්, කුරුඳු කොළ තෙල්, පැහිරි තෙල් සහ පාම් තෙල් භාවිතා කර විවිධ සංයෝග 06ක් මදුරු විකර්ෂක කූරු සකස් කිරීමට භාවිතා කරන ලදී. රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සහයෝගීතාවයෙන් මදුරු විකර්ෂක ක්‍රියාශීලිතාවය පරීක්ෂා කිරීම සිදු කරන ලදී. පිරිසිදු කුරුඳු කොළ තෙල් සහ පැහිරි තෙල් සහිත කූරු ඉහළම මදුරු විකර්ෂක ක්‍රියාකාරිත්වය පෙන්නුම් කළේය. ප්‍රතිඵල තහවුරු කිරීම සඳහා මදුරු විකර්ෂක ක්‍රියාකාරිත්වය නැවත නැවතත් සිදු කරන ලදී.

වාෂ්ප ආසවනය සහ ජල ආසවනය ක්‍රම භාවිතා කරමින් තෝරාගත් ලංකා සිට්‍රොනෙල්ලා (HP T1, HP T2, HP T3) සහ Java Citronella (MP T1 සහ MP T2) ප්‍රවේශ පහකින් සිට්‍රොනෙල්ලා තෙල් නිස්සාරණය කර ඇත. නිස්සාරණය කරන ලද තෙල් ප්‍රමාණය 1.5 -2.7 mL/100 g අතර පරාසයක පැවතුනි. පරීක්ෂා කරන ලද සියලුම පැහිරි තෙල් වර්ග කැන්ඩිඩා ඇල්බිකන්ස් නිෂේධනය කරන ලද අතර එහිදී HP T3 සහ MP T1 තෙල් පිළිවෙළින් ලංකා තෙල් සහ ජාවා තෙල් අතර ඉහළම ප්‍රති-දිලීර ක්‍රියාකාරකම් පෙන්නුම් කරයි. මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කරන්නේ නිස්සාරණය කරන ලද තෙල් C. *albicans* වලට එරෙහිව ප්‍රබල ප්‍රති-දිලීර ක්‍රියාකාරකම් ඉහල තත්ත්වයේ පවතින අතර අනාගත නිෂ්පාදන සැකසීමේදී ස්වාභාවික, ආරක්ෂිත සහ පරිසර හිතකාමී දිලීර නාශකයක් ලෙස භාවිතා කිරීමට හැකි බව තහවුරුවේ. අවසාන නිගමනය නම්, තෝරාගත් Citronella ප්‍රවේශයන්ගෙන් ලබාගත් උසස් තත්ත්වයේ Citronella තෙල් (*Cymbopogon nardus, Cymbopogon Winterianus*), *Candida*sp වලට එරෙහිව දිලීර නාශක ක්‍රියාකාරකමක් පෙන්නුම් කර ඇති අතර එය දිලීරනාශක-ෂැම්පු වලට භාවිතා කළ හැකිය.

ස්වභාවික කල් තබා ගන්නා ද්‍රව්‍යයක් ලෙස කුරුඳු පොතු තෙල් හා ඔලියොරෙසින් ක්‍රියා කිරීම අධ්‍යනය සඳහා, අඹපානය ගබඩා කිරීමේදී එහි භෞතික-රසායනික ගුණාංග කෙරෙහි කල් තබා

ගන්නා ද්‍රව්‍ය සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව මෙම ප්‍රතිඵල සනාථ කරයි. මෙම අධ්‍යයනයට අනුව, 0.2%කුරුඳු තෙල් අඩංගු බීම ක්ෂුද්‍ර ජීවී වර්ධනය පාලනය කිරීමට සහ භෞතික රසායනික ගුණාංග පවත්වා ගැනීමට සහ සති 12 ක් සඳහා 28^0C ගබඩා කිරීමට උපකාරී වේ. තවද 0.2% ඔලියොරෙසින් අඩංගු බීම සති අටක ගබඩා කාලයක් පෙන්නුම් කරයි.මෙම අධ්‍යයනයේ මෙම සොයාගැනීම් මගින් පෙන්නුම් කරන්නේ කුරුඳු තෙල් යනු අඹ බීම දිගු කාලීනව සංරක්ෂණය කිරීම සඳහා රසායනික කල් තබා ගන්නා ද්‍රව්‍ය වෙනුවට භාවිතා කළ හැකි ඒ සමාන ස්වාභාවික කල් තබා ගන්නා ද්‍රව්‍යයක් බවයි.

නොමේරූ කුරුඳු කොළ වලින් 50 ^{0}C උෂ්ණත්වයකදී නිපදවන ලංකා කුරුඳු කොළ තේ සහ පරිණත කුරුඳු කොළ වලින් 60^0C උෂ්ණත්වයකදී නිපදවන ලංකා කුරුඳු කොළ තේ යන දෙකෙහිම ඉහළ පොලිෆෙනොලික් අන්තර්ගතයක්, ෆ්ලේවනොයිඩ් අන්තර්ගතයක් සහ DPPH රැඩිකල් ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් ඉහළ මට්ටමක පවතී. අනෙකුත් තත්ත්ව පරාමිතීන් ගැන සලකා බැලීමේදී, නොමේරූ කුරුඳු කොළ වලින් 50 ^{0}C උෂ්ණත්වයකදී නිපදවන ලංකා කුරුඳු කොළ තේ වඩාත් හිතකර ගුණාත්මක ගුණාංගවලින් යුක්ත වූ අතර එය තරහකාරී වෙළඳපොළට වඩාත් යෝග්‍ය විය.

කැන්ඩිඩා විශේෂ හතරක්(*Candida albicans, Candida tropicalis, Candida glabrata, Candida parapsilosis*) ලුණුවිල ජල සාරය (waterextract) සඳහා කිසිදු බාධාවක් නොපෙන්වයි. නමුත්*Aspergillus* spp. ලුණුවිල ජල සාරය (waterextract) සඳහා වර්ධන බාධාවක් පෙන්නුම් කළේය.

ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයේ පොල් යටතේ වගා කරන ලද කහ දර්ශක වලින් ලබා ගන්නා ලද අස්වනු වල කර්කියුමින් අන්තර්ගතය, තෙතමනය සහ කුඩු කළ කහ වල වර්ණය තීරණය කිරීම

කර්කියුමින් යනු කහවල ගුණාත්මකභාවය තීරණය කරන පරාමිතියක් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලින් පැහැදිලිවම හෙළි වූයේ වගා කරන ලද කහ වර්ග අතර කර්කියුමින් අන්තර්ගතයේ සැලකිය යුතුවෙනස්කම් ($p<0.05$) ඇති බවයි. කහ කුඩු වල කර්කියුමින් ප්‍රතිශතය 0.3458±0.037% සිට 4.9881±0.0141% දක්වා පරාසයක පවතී. ප්‍රතිඵලවලින් පෙනී ගියේ අතරමැදි කලාපයේ පොල් යටතේ වගා කරන කහවල කර්කියුමින් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ සම්මත මට්ටමින් හඳුනාගෙන ඇති 3-6% පරාසයට අනුකූල වන බවයි.

කළු ගම්මිරිස් ධාවක, පාර්ශ්වීය අතු සහ මුදුන් රිකිලි අතරින් තවාන් අවධියේදී වඩාත් සාර්ථක වර්ධක ප්‍රචාරණ අතු වර්ගය හඳුනා ගැනීම සඳහා ධාවක, පාර්ශ්වීය අතු සහ මුදුන් රිකිලි වලින් ලබාගත් දඩු කැබලි වෙන් වෙන්ව ලබාගෙන තවන් පැළ සකසන ලදී.වැඩිමපැලවීමේ ප්‍රතිශතයක් හරස් අතු ධාවකයන්ගෙන් ලබාගත් දඩු කැබලි වල නිරීක්ෂණය විය. හරස් අතුධාවකයන්ගේ (92%) සහ මුදුන් රිකිලි (88.7%) පැලවීමේ ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වෙනස් නොවන අතර පාර්ශ්වික (70%) වලින් ලබාගත් අතු වල පැලවීමේ ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වෙනස් වේ. ඊට අමතරව, හරස් අතු ධාවකයන්ගෙන් ලබාගත් දඩු කැබලිවල වැඩිම උස (26.04cm), වැඩිම නව පත්‍ර බර (2.093g), වැඩිම

දිගින් යුතු මුල් (18cm), වැඩිම නව පුරුක් සංඛ්‍යාව (5) සහ අඩුම රෝග ඇතිවීම (4.66%) නිරීක්ෂණය කරන ලදී.

තවාන් අවධියේදී වඩාත් සාර්ථක කළු ගම්මිරිස් ප්‍රභේදය හඳුනා ගැනීම සඳහා KW31, GM28, MN48, MB12, DM7, IW5, GK49, KW33, TG7 සහ KW27 යන කළු ගම්මිරිස් වරණ දහයක් තෝරා ගන්නා ලදී. තවාන් අවධියේ විවිධ කළු ගම්මිරිස් වරණ අතර සැලකිය යුතු වෙනසක් නොමැති බව අධ්‍යයනයෙන් හෙළි වේ. කෙසේ වෙතත්, MB12 ඉහළම පැලවීමේ ප්‍රතිශතය සහ ඉහළම වියළි අංකුර බර පෙන්නුම් කර ඇත. KW 31 වැඩිම ශාක උස සහ ඉහළම නව අංකුර බර පෙන්නුම් කර ඇත.

බුලත් වර්ධනයට හා ගුණාත්මක භාවයට කෘත්‍රිම ආලෝකයේ බලපෑම අධ්‍යයනය කිරීමේදී බුලත් වර්ධනයට සහ ගුණාත්මක භාවයට LED විදුලි පහන්වල බලපෑම අධ්‍යයනය කරන ලදී. 40% සෙවන යටතේ සිදු කරන ලද පරීක්ෂණයක දී, සුදු සහ නිල් LED විදුලි පහන් ද ස්වභාවික හිරු එළිය හා සමාන ප්‍රතිපල පෙන්වා ඇති නමුත් රතු ආලෝකය මගින් වර්ධනය අඩු වී ඇත.

බුලත් වර්ධනය හා අස්වැන්න සඳහා ශාක ඝනත්වය සහ ශාකයේ ව්‍යුහය අධ්‍යයනය කරන ලදී. ප්‍රතිඵලවලින් පෙනී ගියේ ‘‘කඳ කොළ’’ පලමු වසරේ අස්වැන්න එක් කණුවකට පැල හතරක් යටතේ ලැබෙන ප්‍රමාණය කණුවකට පැල දෙකකට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බවයි. කෙසේ වෙතත්, වෙනත් කිසිදු වර්ධනයක හෝ අස්වැන්න පරාමිතීන් සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කළේ නැත.

බුලත් සඳහා විකල්ප තවාන් බඳුන් මිශ්‍රණ ඇගයීම (*Piper betle* L.) ඉතා වැදගත්වේ. මතුපිට පස්, කොහුබත්, වැලි, ගොම, කොම්පෝස්ට්, එළු පොහොර, අර්ධ වශයෙන් පිළිස්සූ දහයියා (PBPH) සහ කුකුළු පොහොර යන විවිධ අනුපාත යොදා ගනිමින් තවන් බඳුන් මිශ්‍රණ හතක් සකස් කරන ලදී. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA) විසින් නිර්දේශිත තවාන් මිශ්‍රණයට (පස්: වැලි: කොහුබත්: ගොම 1:1:1:1) සාපේක්ෂව ඉහත නව බඳුන් මිශ්‍රණ හත පිලිබඳව අධ්‍යයනය කරන ලදී. බුලත් තවාන් නිෂ්පාදනය සඳහා හොඳම විකල්ප භාජන මිශ්‍රණය ලෙස මතුපිට පස්: වැලි: කොහුබත්: කොම්පෝස්ට් (1:1:1:1) නිර්දේශ කළ හැක.

Spent Button Mushroom Compost (SMC) යනු බිම්මල් වගාවේ වටිනා අතුරු නිෂ්පාදනයකි. බුලත් තවාන් බඳුන් මිශ්‍රණයට SMC ඇතුළත් කිරීමේ හැකියාව ඇගයීමට ලක් කරන ලදී. බඳුන් මිශ්‍රණය SMC:මතුපිට පස: වැලි (1:1:1), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත බඳුන් මිශ්‍රණයට සමානතාවයක් පෙන්නුම් කරන බැවින්, බුලත් තවාන් බඳුන් මිශ්‍රණයට බිම්මල් කොම්පෝස්ට් ඇතුළත් කළ හැක.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුලත් වගාවන්හි පාංශු සාරවත් බව සහ පෝෂක කළමනාකරණය පිලිබඳව අධ්‍යයනය කිරීමේදී බුලත් වගාවේ ඇති අභියෝග ඉස්මතු වන අතර, විශේෂයෙන් රසායනික පොහොර අධික ලෙස භාවිතය නිසා ඇති වන පෝෂ්‍ය පදාර්ථ අහිමි වීම සහ කාබනික සහ අකාබනික පොහොර සමඟ සමබර පෝෂක යෙදීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.පොහොර යෙදීම සහ බුලත් අස්වැන්න අතර ඍණාත්මක සහසම්බන්ධතාවය බුලත් සඳහා අධික මාත්‍රාවෙන් පොහොර භාවිතයේඇති අහිතකර බලපෑම් පෙන්නුම් කරයි. සාරාංශයක් ලෙස, රසායනික පොහොර මත අනවශ්‍ය ලෙස යැපීම මගින්,ජල මුලාශ්‍ර වලට කාන්දු වීම, ගලා යාම සහ වාෂ්පීකරණය හරහා

පාරිසරික ගැටළු ඇතිවීමේ අවදානම සමඟ අමතර වියදම් දැරීමට හේතු විය හැකි බව පැහැදිලි වේ. බුලත් වගාවේ අස්වනු ප්‍රශස්ත කිරීම සඳහා තිරසාර පෝෂක කළමනාකරණ පිළිවෙත් පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

බුලත් වල බැක්ටීරියා කොළ අංගමාරය පාලනය කිරීම සඳහා දේශීය ශිල්පීය ක්‍රම භාවිතා කිරීම පිළිබඳ විමර්ශනය (*Piper betle* L.) කිරීම වැදගත් අතර එහිදී, පළමු පියවරේදී බුලත් පර්යේෂණ ස්ථානයේ ස්ථාපිත පර්යේෂණ ක්ෂේත්‍රයේ පහත ප්‍රතිකාර ක්‍රම යොදන ලදී. T1 - කජු අතු පුළුස්සා ලැබෙන අළු යෙදීම, T2 - කජු ලෙලි පුළුස්සා ලැබෙන අළු යෙදීම, T3 - කැප්පෙටියා කොළ වසුන් ලෙස සෑම මාස 6 කට වරක් යෙදීම, T4 - නිදිකුම්බා සෑම මාස 6 කට වරක් වසුන් ලෙස යෙදීම, T5 - හීරැස්ස පලු සිටුවීම, T6 - මුරුංගාසිටුවීම. වසර 3 ක පර්යේෂණ කාලය තුළ බැක්ටීරියා කොළ අංගමාරය රෝගය ස්වභාවිකව මතු නොවීය. දෙවනුව මෙම පර්යේෂණය බාහිර ක්ෂේත්‍රයක ස්ථාපිත කරන ලදී. මෙම ක්ෂේත්‍රයේ ද බැක්ටීරියා කොළ අංගමාරය රෝගයේ සලකුනු දක්නට නොලැබුණි. ඉහත ප්‍රතිකාර ක්‍රම මාතලේ මධ්‍යම පර්යේෂණ ස්ථානයේ රසායනාගාර තුල වගා කරන ලද *Xanthomonas cappestrisbetlicola*සඳහා යොදන ලදී. කජු ලෙලි, කැප්පෙටිය, නිදිකුම්බා සහ මුරුංගා නිස්සාරණයෙන් *Xanthomonas cappestrisbetlicola*හි වර්ධනය සම්පූර්ණයෙන්ම පාලනය වී ඇති බව ප්‍රතිඵලවලින් අනාවරණය වී ඇත. එබැවින් නිවැරදි පොහොර නිර්දේශ භාවිතා කරන අතර, බුලත් වල බැක්ටීරියා කොළ අංගමාරය කළමනාකරණය සඳහා ඉහත ප්‍රතිකාර ක්‍රම භාවිත කළ හැකිය.

ප්‍රකාශන

- ප්‍රේමලාල් ඩබ්. ටී.ටී.එස්., සුබසිංහ එච්.එම්.පී.ඒ., ගුණතිලක එච්. ඒ.ඩබ්. එස්., කරුණාරත්න කේ.එච්.එම්.අයි. සහ යටවත්ත වී. ජේ.., ආධාරක ගසේ)*Gliricidiasepium*) වියනේ වර්ධනය සමඟ විවිධ කළු ගම්මිරිස් ප්‍රභේදවල) *Piper nigrum* L.) ක්ෂුද්‍ර කාලගුණ විද්‍යාත්මක පරාමිතීන් සහ අස්වැන්න ගුණාංග වෙනස් වීම
- තෙන්නකෝන් එම්.ආර්.අයි.ඩබ්ලිව්., ලියනගේ කේ .ජේ.කුමාර සහ යටවත්ත වී .ඩී.ඒ.එල්. ගම්මිරිස් තවාන් පැලවල වර්ධනය හා සංවර්ධනය සඳහා කාබනික සහ අකාබනික ද්‍රව පොහොරවල ඵලදායිතාව තක්සේරු කිරීම
- යටවත්ත වී. ජේ.., මොහොට්ටි ඒ. ජේ., සුබසිංහ එච්.එම්.පී.ඒ., සහ එරබදුපිටිය එච්.ආර්.පී.බී., ඉඟුරු (*Zingiberofficinale* Roscoe) රයිසෝම සඳහා ප්‍රශස්ත අස්වනු නෙලීමේ වයස හඳුනා ගැනීම බීජ ද්‍රව්‍ය ලෙස පැළ ප්‍රමාණය සහ වෘක්ෂලතා දත්ත භාවිතා කිරීම.
- දිසානායක, ඩී.ජී.එච්.එම්.කේ., (PDF) එනසාල් සඳහා සාම්ප්‍රදායික නයිට්‍රික් අම්ල බීජ ප්‍රතිකාරය සඳහා විකල්පයක් ලෙස ෆෝමික් අම්ලය ඇගයීම, [*Elettaria cardamomum* (L.) Maton] බීජ අස්වැන්න, ප්‍රරෝහණය සහ තවාන් වල බීජ පැල පැවැත්ම.2023 ජූනි 25 දින ලබා ගන්නා ලදී.
- https://www.researchgate.net/publication/371851725_Evaluation_of_Formic_Acid_as_an_Alternative_for_Conventional_Nitric_Acid_Seed_Treatment_for_Cardamom_El

ettaria_cardamomum_L_Maton_on_Seed_Yield_Germination_and_Seedling_Survival_in_Nursery

- අහේරත්න ආර්.එම්.එස්.ඩී.එල්.,(Pdf) ශ්‍රී ලංකාවේ සාදික්කා වල රූප විද්‍යාත්මක සහ අණුක විවිධත්ව (*Myristica fragrans*Houtt.).2023 අගෝස්තු 15 දින ලබා ගන්නා ලදී.
- https://www.researchgate.net/publication/374910203_MORPHOLOGICAL_AND_MOLECULAR_DIVERSITY_OF_SRI_LANKAN_NUTMEG_Myristica_fragrans_Houtt
- ටී .ඊ්.වීරවර්ධන, ඒ. පී ඕන්කෙන්ද, පී.ආර්. ඉඩමෙකෝරාල 2023 : ශ්‍රී ලංකාවේ කළු ගම්මිරිස් (පයිපර් නිග්‍රම්) සඳහා සුදුසු කෘෂි පාරිසරික කළාප සිතියම්ගත කිරීම) .(එඩි.ස්. බී.මාපා).ආර්, (අපනයන කෘෂිකර්ම බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණයේදී)වෙළුම -6 පිටු 82-92, 22-23 ජූනි.පේරාදෙණිය, ශ්‍රී ලංකාව
- T. E. වීරවර්ධන , S H I සුවදි , P.R. ඉඩමේකෝරල සහ W.M.S.R.බණ්ඩාර)2023) : කළු ගම්මිරිස් දඬු කැබලිවල කඩිනම් වර්ධන අනුපාතය සඳහා විවිධ බදුන් මිශ්‍රණ සහ සංයෝග පොහොරවල බලපෑම)Npk 21:7:14), අපනයන කෘෂිකාර්මික භෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය වෙළුම 6, පිටු 106-116, 22-23 ජූනි.පේරාදෙණිය, ශ්‍රී ලංකාව
- ටී.ඊ්.වීරවර්ධන, එච්.කේ.ඒ.ඩී.ගුණරත්න, පී.ආර්.ඉඩම්කොරල, ඩී .අයි දෙණියපහල සහ. ජේ.ආර්.එම්.ඩබ්ලිව්.බී.ඩබ්ලිව්2023 විවිධ සංයෝග පොහොරවල පොටෑසියම් ප්‍රභවයන්ගේ බලපෑම සහ ඒවායේ යෙදීම් වාර ගණන, වර්ධන හා ඵලදායිතාවයේ වාර්ෂික වර්ධනය (එස්. බී. ආර්. මාපා), වෙළුම 6, පි 122-13, 22-23 ජූනි.පේරාදෙණිය, ශ්‍රී ලංකාව
- විජේකෝන්,ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.ආර්.එම්.සමරනායක,ඩීඑච්.එස්..ජී.ඒ.,කොඩිතුවක්කු,ආර්.ඩී.සහ දෙණියපහල, D.V.R.I.(2023).ශ්‍රී ලංකාවේ මැද රටින් වාර්තා වී ඇති කරාබුනැටි කොළ කුණුවීම සහ පත්‍ර පැල්ලම් රෝග සඳහා හේතුව හඳුනා ගැනීම සහ තහවුරු කිරීම, අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය(එඩිස්. බී. ආර්. මාපා) වෙළුම-6 පි 195-203 22-23ජූනි පේරාදෙණිය ශ්‍රී ලංකාව.
- කොඩිතුවක්කු. විජේකෝන්, ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.ආර්.එම්., ෆොන්සේකා, ඩබ්ලිව්.ඩී.එන්.ඒ., සහ මුතුරන්වැලිගේ, ඩී).ඩී.2023).Phylostictazingiberi විසින් ඉඟුරු (Zingiber officinale) පත්‍ර ලපවලට එරෙහිව ඒවායේ ජෛව කාර්යක්ෂමතාව සඳහා තෝරාගත් ශාක සාරයන් ඇගයීම, අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය (එඩිස්. බී. ආර්. මාපා)වෙළුම -6 පිටු187-194 ජූ22- 23 ජූනි පේරාදෙණිය ශ්‍රී ලංකාව.
- එච්.පී.ආර්.එම්.ලක්මාලි, එච්.එල්.එෆ්.උපේන්ද්‍රි, ටී ලියනගේ, එච්.ඒ.පී.එම්.සුබසිංහ, 2023, කළු ගම්මිරිස්*(Piper nigrum* L.) සැකසීමේදී දිලීර ආසාදනයට බීජ වෙන්කිරීම, උණුවතුර ප්‍රතිකාරය සහ වියලීමේ බලපෑම, තිරසාර වැවිලි කළමනාකරණ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පිටු අංක-179

- එච්.පී.ආර්.එම්.ලක්මාලි, ටී ලියනගේ, එච්.ඒ.පී.එම්.සුබසිංහ, ජේකිර්තිසිංහ .පී., 2023 කළු ගම්මිරිස් (*Piper nigrum*) වල වාශ්පශීලි තෙල් ප්‍රමාණය සඳහා සැකසීමේ ක්‍රියා පටිපාටිවල බලපෑම, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 7 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව පිටු අංකය :171

- එච්.පී.ආර්.එම්.ලක්මාලි, ටී ලියනගේ, එච්.ඒ.පී.එම්.සුබසිංහ , ජේ.පී.. කිර්තිසිංහ, 2023(කළු ගම්මිරිස්) (Piper nigrum L.)වල දිලීර ආසාදනය සඳහා බීජාවරණය මත නටුවෙන් බීජ වෙන් කිරීමේ ක්‍රමයේ සහ සැකසුම් ක්‍රියා පටිපාටි බලපෑම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසි -iPURSEවිශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකා Page 232

- එච්.පී.ආර්.එම්.ලක්මාලි, ටී ලියනගේ, එච්.ඒ.පී.එම්.සුබසිංහ, ජේ.පී.කිර්තිසිංහ, 2023 කළු ගම්මිරිස්වල පයිපරීන් අන්තර්ගතය මත නටුවෙන් බීජ වෙන් කිරීමේ ක්‍රමයේ,උණුවතුර ප්‍රතිකාරය සහ වියලීමේ බලපෑ ව්‍යවහාරික සහ විද්‍ය (පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය -icaps 2023 කලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව පිටු අංකය :181

- එච්.පී.ආර්.එම්.ලක්මාලි, ටී ලියනගේ, එච්.ඒ.පී.එම්.සුබසිංහ , J.P. කිර්තිසිංහ, 2023 කළු ගම්මිරිස්වල තත්ත්ව පරාමිතීන් පිළිබඳ සැකසුම් දාමයේ බලපෑම පාරිසරික සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය කඳුරැල්ල පරිසර විද්‍ය යහපැවැත්ම :සම්බන්ධකිරීම කිරීම -ICEN 2023 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.පිටු අංකය :90

- එස්හෙට්ටිආරච්චි .එස්., වීරක්කොඩි එම්තක්ෂිලා කුමාරි .අයි., සහ රංජනී අමරකෝන්, 2023 "සියඹලා(*Tamarindusindica*)බීජ වලින් සයිලොග්ලූකන් පොලිමර් නිස්සාරණය කිරීම."උසස් රසායන විද්‍යා පර්යේෂණ පිළිබඳ යුරෝපීය සඟරාව.2023. DOI: http://dx.doi.org/10.24018/ejchem.2023.4.1.9

- එස්හෙට්ටිආරච්චි.එස්., ජීතිලකරත්න., ආර්.ජී.එම්.රාජපක්ෂ, "ශ්‍රී ලංකාවේ වගා කරන කහ (*Curcuma longa*) වලින් නිස්සාරණය කරන ලද Curcumin භාවිතා කරමින් Curcumin Zinc Oxide Nanocomposite සංශ්ලේෂණය."අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය2023. pg: 214-227.

- ඒ.අයි.කරුණාරත්න, ටී ලියනගේ., එස්හෙට්ටිආරච්චි.එස්., කේසෙන්තුරන්., ඒරණවක., 2023 (ශ්‍රී ලංකාවේ කහ වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්කවලින් එකතු කරන ලද කහවල කර්නියුමින් අන්තර්ගතය) අපනයන කෘෂිකාර්මික සම්මන්ත්‍රණය2023.

- සෙනෙවිරත්න, එස්.එම්.පී.ආර්., ලියනගේ ටී., අබ්දුල් මජීඩ් යූඑල්.,.කරුණාරත්න ඒ., සෙන්දුරන්, කේ., 2023, අම්පාර දිස්ත්‍රික්කවල විවිධ ස්ථානවල වගා කරන ලද වියළි කහවල (*Curcuma longa* L.) කර්කියුමින් අන්තර්ගතය තීරණය කිරීම, තාක්ෂණික පර්යේෂණ සහ නවෝත්පාදන පිළිබඳ 1 වන ජාත්‍යන්තර සමුළුවේ, තාක්ෂණ පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවපිටුව :24

- පබසරා, පී.කේ.ඩී., සහ සමරවීර, ඩී.එන්. .(2023) කුරුඳු (Cin*amomum zeylanicum* Blume) රිකිලි ඇතිවීමට කඳ නැමීමේ බලපෑම .අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණයේ වාර්තා සටහන්) පිටු 44-48 පේරාදෙණිය, ශ්‍රීලංකාව :අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
- වීරසිංහ, ඒ.එම්., පබසරා, පී.කේ.ඩී., විතානගේ, එන්.එස්., සහ රණවන, එස්.ආර්.ඩබ්ලිව්.එම්.සී.ජේ.කේ (2023) .සරල ලයිසි මීටරය සහ පෑන් වාෂ්පීකරණ ප්‍රවේශයන් භාවිතා කරමින්) සත්‍ය කුරුඳු ,*Cinnamomum zeylanicum*Blume) බෝගයේ මුල්අවධියේදී ජල අවශ්‍යතාවය සහ බෝග සංගුණකය ඇස්තමේන්තු කිරීම .නිවර්තන කෘෂි පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පිටුව .(105 කොළඹ, ශ්‍රීලංකාව :කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය.)
- මල්කාන්ති, එම්.ඩී., පබසරා.පී ,කේ.ඩී., වීරසූරිය, එස්.එන්,.මිහිරිතරංගා.කේ ,එච්.ජී(2023) ., (යටිපස් මධ්‍යයේ සිටුවන ලද කුරුඳු) *Cinnamomum zeylanicum* Blume) බීජ පැල වර්ධනයට අකාබනික පොහොර වල බලපෑම .අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය (මාපා, ආර් .බී .එඩිස්) වෙළුම 06 , පිටු121-117 , 23-22ජූනි .පේරාදෙණිය, ශ්‍රීලංකාව
- පුවත්පත් ලිපි: "GAP ක්‍රමයට කුරුඳු වගාවක් අරඹමුද?ගොවිමිණ - "
- ශ්‍රී ලංකාවේ ගම්මිරිස්(*Piper nigrum)* පත්‍ර ගැටිති සාදන පැළමැක්කාගේ රූප විද්‍යාත්මක නාමකරණය, සී.යූ. විදානපතිරණ, එම්.ආර්. යුලිටිස්කා, එස්.ඒ. යැප්, වාර්ෂික පර්යේෂණ සමුළුව, 2023, ශ්‍රී ලංකා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
- ලංකාවේ වගා කළ කුරුඳුවල(*Cinnamomum verum* J.Presl. synonym: *Cinnamomum zeylanicum* Blume), *Thalasso desimmissaria*Walker 1861 (ලෙපිඩොප්ටෙරා : කුළයජියොමෙට්‍රිඩේ) ගේ රූප විද්‍යාත්මක හඳුනාගැනීම සහ ජීවන චක්‍රය විස්තර කිරීම සහ හානිය ඇගයීම, ජීවන්තඑස්., සී.යූ. විදානපතිරණ, බන්දුසේකර, එස්., ජයසිංහජී.ජී., වාර්ෂික පර්යේෂණ සමුළුව, 2023, ශ්‍රී ලංකා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
- කුරුඳුවල(*Cinnamomum zeylanicum* Blume) නිස්සාරිත තෙල්වල ප්‍රමාණය කෙරෙහි පත්‍රකණින්නාගේ(*Acrocercops*spp.) බලපෑම හඳුනාගැනීම, එස් .නගුලේස්වරන්, විදානපතිරණසී.යූ., විජේවීරඒ.ඒ., විජේසුන්දරඑන්.එම්., 7 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රීලංකාව, 17 - 18අගෝ2023
- කුරුඳු (*Cinnamomum zeylanicum* Blume) ශාකයේ කඳහි ඇතිවන කඳ පිළිකා තත්ත්ව අස්වනු හානිවීමට බලපාන ආකාරය සහ රෝග ලක්ෂණ වර්ධනය වීමේ රටාව අධ්‍යයනය. (2023), එච්.එම්.ටී.ටී.මධුරංගි, ජී.ජී. ජයසිංහ, සී.යූ. විදානපතිරණ, සහසී. මැද්දෙගොඩ. අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණයේ කාර්ය වාර්තාව, 202-213පිටු.

- ආර්.එස්. මධුවන්ති, එච්.එම්.ටී.ටී.මධුරංගි, සහඑන්.ඩබ්ලිව්. ගුණසේකර. , (2023), විවිධ පසු අස්වනු ප්‍රතිකාරය ටතේ තබා ඇති සැකසූ කුරුඳුවල ක්ෂුද්‍ර ජීවී ප්‍රමාණය හා විවිධත්වය විමර්ශනය කිරීම කෘෂිකර්මය පිළිබඳ 3වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ කාර්ය වාර්තාව, 54-56පිටු.
- රූපසිංහ.,සී.ටී., තරංගා, කේ.එච්.ජී.එම්., හේරත්, එච්.එම්.එස්.කේ., පෙරේරා., ටී.ඒ.එන්.ටී., කුරුඳු වල පාංශු භෞතික රසායනික ගුණ මතඩොලමයිට් යෙදීමේ බලපෑම) *Cinnamomum zeylanicum* Blume,. ICIET/ බලශක්ති සහ තිරසාරභාවය171/2023/, නැගී එන තාක්ෂණයන් පිළිබඳ නවෝත්පාදන පිළිබඳ ජාත්‍යන්තර සමුළුව.2023
- අනුරාධ,එම්, ඩි., තරංගා, කේ.එච්.ජී.එම්., දිසානායක, එම් .එල් . එල්. එම් .සී., මධුරංගි., එච් . එම් .ටී.ටී .තෝරාගත් පසෙහි කුරුඳු කොළ කොම්පෝස්ට්වල බලපෑම කුරුඳු(*Cinnamomum zeylanicum* Blume) වල ඇතිගුණ, 27 වැනි ජාත්‍යන්තර වන විද්‍යා සහ පරිසර සම්මන්ත්‍රණය 2023, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රීලංකාව.
- මල්කාන්ති, එම්.ඩී., පබසරා.පී ,කේ.ඩී., වීරසූරිය, එස්.එන්,.මිහිරිතරංගා.කේ ,එච්.ජී(2023) ., යටිපස් මධ්‍යයේ සිටුවන ලදකුරුඳු) *Cinnamomum zeylanicum* Blume) බීජ පැල වර්ධනයට අකාබනික පොහොරවල බලපෑම .අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය (එඩිස්. මාපා ආර්. බී.) වෙළුම 06 , පිටු121-117 , 23-22ජූනි .පේරාදෙණිය, ශ්‍රීලංකාව
- පුවත්පත් ලිපි: ‘‘වැඩි අස්වැන්නක් වැඩි ගුණාත්මයක්සඳහානවකුරුඳුප්‍රභේදගොවිමිණ - ’’
- පබසරා, පී.කේ.ඩීවිජේවීර ඒ.ඒ., රණවීරකේ.කේ.ඩී.එස්., 2023, හඳුන්වා දුන් සත්‍ය කුරුඳු වල ශ්‍රී ගැමුණු ප්‍ර භේදය වෙතින් නව වටිනාකම් එකතු කළ කුරුඳු කොළ තේ නිෂ්පාදනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ 28 වන ජාත්‍යන්තර වන විද්‍යා හා පරිසර සම්මන්ත්‍රණය.
- කේ.ආර්.ඩී.ප්‍රභාෂ්වර, ඒ.ඒ.විජේවීර, එච්.එස්.ඩබ්ලිව්.ඒ.ගුණතිලක සහ සී.යූ.විදානපතිරණ, 2023,සැකසූ කුරුඳු කූරු මත සල්ෆර් ධූමකරණයේ බලපෑම තීරණය කිරීම,ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 21 වැනි කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණය)I කොටස
- ඩබ්ලිව්.එස්.සඳරුවන්, ඒ.ඒ.විජේවීර සහ එච්.එස්.ඩබ්ලිව්.ඒ.ගුණතිලක, 2023, කුරුඳු වල පොතු ගැලවීමේ හැකියාව මත සාපේක්ෂ ආර්ද්‍රතාවය සහ උදම් විචලනයේ බලපෑම, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 21 වන කෘෂිකර්ම පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියාදාමයන්)I කොටස
- දිනෙල්කා, එස්.එන්.ඒ., දිසානායක, ඩී.වී.පී.එම්., ප්‍රේමතිලක, යූ.ටී.ඒ.ජී., වීරසූරිය, ජී.එන්.ඒ.පී., 2023 බුලත් සඳහා විකල්ප තවාන් බඳුන් මිශ්‍රණ ඇගයීම,නිවර්තන කෘෂිකාර්මික පර්යේෂණ, 2023
- දිසානායක, ඩී.වී.පී.එම්., රණසිංහ, ආර්.ඒ.ආර්.ඩී.ඒ.,2023 කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුලත් වගාවන්හි පාංශු සාරවත් බව සහ පෝෂක කළමනාකරණය තක්සේරු කිරීම (පයිපර් බීට්ල්), විද්‍යා හා තාක්ෂණ පිළිබඳ 3 වැනි ජාත්‍යන්තර සමුළුව)ICST 2023
- කරුණාරත්න, ටී.එම්.සී.එෆ්., සුබසිංහ, එච්.ඒ.පී.එම්., චන්ද්‍රරත්න, ඩබ්ලිව්.එම්., රූපසිංහ, කේ.ඒ.එස්.ඒ.සහ කෞශල්‍යා එල්. ජේ. (2023): කහ වල රෝපණ ද්‍රව්‍යවල බර (*Curcuma longa* L.) සහ අතරමැදි කලාපයේ ඒවායේ වර්ධනය සහ අස්වැන්න ක්‍රියාකාරිත්වය

ඇගයීම.අපනයන කෘෂිකාර්මික භෝග පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය වෙළුම 6, පි 31-43, 22-23 ජූනි.පේරාදෙණිය, ශ්‍රී ලංකාව

- මුණසිංහ, එම්. එස්. එස්., කොකෝ-පීට් තවාන් මධ්‍යයේදී ගම්මිරිස් විවිධ වරනයන්ගේ හැසිරීම අධ්‍යයනය. අපනයන කෘෂි බෝග සම්බන්ද වාර්ෂික සමුළුව 2023 .ජුනි .
- මුණසිංහ, එම්. එස්. එස්., නාරන්වල, ටී. එම්. ඩි. එන්., සිල්වා, එස්. අයි. සී., අතරමැදි කලාපයේ පොල් යටතේ වගා කල කහ බෝගයේ අස්වනු වල කර්කියුමින් ප්‍රතිශතය, තෙතමන ප්‍රතිශතය හා වර්ණය අධ්‍යයනය. විද්‍යා හා තාක්ෂණය පිලිබඳ තුන්වන ජාත්‍යන්තර සමුළුව ,(2023) අග්නිදිග විශ්වවිද්‍යාලය .
- රණසිංහ ආර්.ඒ.ආර්.ඩී., ප්‍රියදර්ශනී කේ.ඩී.එන්., දිසානායක ,ඩි .එම් .පී .වී ,.සහ රූපසිංහ කේ.එ.එස්.**(2023)** බුලත් වර්ධනයට සහ අස්වැන්නට සෙවන දැල් වල බලපෑම.තිරසාර වැවිලි කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය)**ISSPM)-2023**, 2023අගෝස්තු **04,** මාලබේ.පි **54-63.**ජාතික වැවිලි කළමනාකරණ ආයතය, ශ්‍රී ලංකාව
- සිල්වා, එස්. අයි. සී., ධර්මපරාක්‍රම, ඒ. එල්. එස්., මුණසිංහ, එම්. එස්. එස්., ශාමක, ඩබ්ලිව්. ඒ. ඒ. එච්., ශාන්ත, කේ. ජී. පී., අමරකෝන්, එස්., මල්කාන්ති, එම්. එම්. එස්., අතරමැදි කලාපයේ පොල් වගාව යටතේ වගා කල කහ දර්ශ පිලිබඳ අධ්‍යයනය.අපනයන කෘෂි බෝග සම්බන්ධ වාර්ෂික සමුළුව 2023 .ජුනි.
- වන්සේකර, ඩබ්ලිව්. වී. ඩි., දිසානායක, ඩි. එම්. පී. වී., සහ ප්‍රේමතිලක යූ. ජී. ඒ. ටී., බුලත් තවාන් මිශ්‍රණයට බිම්මල් වගාවෙන් පසු ඉවත් කල බිම්මල් බදුන් මිශ්‍රණය (SMC) භාවිතා කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම. කෘෂිකර්මය හා පරිසරය පිලිඹද ජාත්‍යන්තර සමුළුව. කෘෂිකර්ම පීටය, රුහුණ විශ්ව විද්‍යාලය. (2023)
- ප්‍රියදර්ශනි,කේ.ඩී.එන්. රූපසිංහ,පී.ඒ.එච්.අයි. සහනිලන්ත ,කේ.ඒ.ආර්. (2023). අභ්‍යයන්තර ප්‍රචාරණය කරන ලද කහ (*Curcuma longa*)වල වර්ධනය සහ රයිසෝම අස්වැන්න මත ඉහළ ගුණනය කිරීමේ චක්‍ර වල බලපෑම ඇගයීම, අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ වාර්ෂික සමුළුවේ ක්‍රියාවලිය වෙළුම 6 Pg.49-54.
- රණසිංහ,ආර්.ඒ.ඩී.ආර්.ඒ., ප්‍රියදර්ශනි,කේ.ඩී.එන්., දිසානායක,ඩී.එම්.පී.වී. සහ රූපසිංහ, කේ.ඒ.එස්.ඒ. (2023) බුලත් වර්ධනය සහ අස්වැන්න කෙරෙහි සෙවන දැල්වල බලපෑම, ශ්‍රී ලංකා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද තිරසාර වැවිලි කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ISSPM) -2023 Pg.54 – 63.
- රූපසිංහ,පී.ඒ.එච්.අයි., ප්‍රියදර්ශනි, කේ.ඩී.එන්සහ වීරසිංහ,එල්.එන්. (2023) කුරුඳු පටක රෝපණය (*Cinnamomum zeylanicum Blume.*), අපනයන කෘෂිකාර්මික භෝග පිළිබඳ වාර්ෂික සමුළුවේ ක්‍රියාවලිය වෙළුම 6 Pg.76-81.

- 2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

2.2.1. අභියෝග

1. 2023 සැප්තැම්බර් මස 01 වන දින කුරුඳු බෝගය සඳහා වෙනම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලද අතර දෙපාර්තමේන්තුව විසින් වැඩි දායකත්වය ලබා දෙන බෝගයක් ලෙසින් කුරුඳු බෝගය හඳුන්වා දිය හැකි අතර එම බෝගය දෙපාර්තමේන්තු විෂය පථයෙන් ඉවත් කිරීම ඉදිරි සංවර්ධන ඉලක්ක හා අපනයන ආදායම කරා යාමේදි අභියෝගයට ලක්විය.

2. දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රශස්ත මට්ටමෙන් සැපයීමට නොහැකියාවක් පැවති අතර නිලධාරින් සඳහා කාර්යාල පහසුකම්, උපකරණ හා භාණ්ඩ අවශ්‍යතාවයන් හා ප්‍රවාහන පහසුකම් නියමිත පරිදි සැපයීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට සතුව නොමැති වීම අභියෝගයක් විය.

3. සියළුම පර්යේෂණ මධ්‍යස්ථානයන්හි රසායනාගාරවල යටිතල ව්‍යුහයන් (විද්‍යාත්මක උපකරණ, රසායනික ද්‍රව්‍ය,වීදුරු භාණ්ඩ හා පාරිභෝගික ද්‍රව්‍ය) සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන නොමැතිකම.

4. මානව සම්පත් හිඟය
   මේ වන විට සියළුම පර්යේෂණ මධ්‍යස්ථාන වල විවිධ මට්ටම්වලට අයත් බොහෝ සේවක තනතුරු වල පුරප්පාඩු පැවතීම.

5. ඉන්ධන හිඟය සහ අධික ඉන්ධන පිරිවැය නිසා ගොවි ක්ෂේත්‍රවලදී සිදු කරන උපයෝගීතාව සම්බන්ධ පර්යේෂණ සිදු කිරීමට විශාල බාධකයක් වී ඇත.

2.2.2. අනාගත ඉලක්ක / අරමුණු

- අපනයන ආදායම ඉහළ නැංවීම.
  2023 වසරේ දී අපනයන කෘෂි බෝග මෙට්‍රික් ටොන් 63,232.77 ක් අපනයනය මඟින් රුපියල් මිලියන 157,423.36 ක ආදායමක් ජාතික ආර්ථිකයට එක් කිරීමට හැකි විය. එය පෙර වර්ෂයට වඩා ඉහළ අගයක් ගනු ලැබූ අතර, වසර 2025 වන විට අපනයන ආදායම රුපියල් බිලියන 100 ඉලක්කය සපුරා ගැනීමේ අනාගත ඉලක්කය වී ඇත. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී වගා වපසරිය වැඩි කිරීම, ලබා ගත හැකි අස්වැන්න වැඩි කිරීමට හා බෝග වගාකරුවන් , නිෂ්පාදකයින්, සැකසුම්කරුවන් හා අපනයනකරුවන් සම්බන්ධීකරණය තුලින් වැඩි විදේශ ආදායමක් ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලද අතර ඉදිරි වසරේදී අපනයන කෘෂි බෝග පාර්ශ්වකරුවන්ගේ ආදායම තවදුරටත් ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ.

- කෝපි වගාව සංවර්ධනය කිරීම

  ඉදිරි වසර කීපය තුල වතු අංශයේ මහා පරිමාණයෙන් කෝපි වගාව ව්‍යාප්ත කිරිමට බලාපොරොත්තු වන අතර මේ සඳහා වතු අංශයේ ඉහළ කළමනාකාරීත්වය හා නිළධාරින් සමඟ වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරිම හා මහා පරිමාණයෙන් කෝපි වගා කිරිමේදි මතුවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ සක්‍රීය දායකත්වය ලබා දීමට අපේක්ෂා කෙරේ. කෝපි සැකසිම හා අගය එකතු කල නිෂ්පාදන මඟින් අපනයන වෙලෙඳපොළ ජය ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දායකත්වය සෘජුවම ලබා දීමට බලාපොරොත්තු වේ.

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහන ප්‍රචලිත කිරීම.

  මේ යටතේ ආර්ථිකව වැඩි විදේශ විනිමයක් ඉපයීම සඳහා අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් , අගය එකතුකළ නිෂ්පාදන ලෙස දේශීය හා විදේශීය වෙළඳපලට ඉදිරිපත් කිරීම මඟින් වැඩි ආදායමක් ලබා ගැනීම හා යහපත් කෘෂි කාර්මික හා නිෂ්පාදන පිළිවෙත් ක්ෂේත්‍රයේ නිරත වගාකරුවන් හා නිෂ්පාදන කරුවන් අතර ප්‍රචලිත කරවීමට සැලසුම් කර ඇත. ඒ යටතේ උනන්දුව සහිත නිෂ්පාදකයන් ආකර්ෂණය කර ගෙන සහතික කරන ලද අපනයන කෘෂි බෝග නිෂ්පාදන අපනයනයට හා නියාමනය සඳහා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. මේ යටතේ වැඩි අපනයන කෘෂි බෝග නිෂ්පාදන ප්‍රමාණයක් විදේශ වෙළෙඳපලට ඉදිරිපත් කරමින් වැඩි විදේශ ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව අපනයන කෘෂි බෝග සඳහා භාවිත සංග්‍රහයන් සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

- කාබනික භෝග වගාව ප්‍රචලිත කිරීම.

  රසායනික පොහොර භාවිතය අවම කර, කාබනික පොහොර නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම සඳහා සහ ආර්ථිකව වැඩි මිලක් ලබා ගැනීම සඳහා කාබනික වගාවන් කෙරෙහි ගොවීන් වඩාත් උනන්දු කරවීම සඳහා කාබනික වගා වැඩසටහ ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ කාබනික අපනයන කෘෂි බෝග වගා වපසරිය ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කර ඇත. එහිදී දෙපාර්තමේන්තුව මඟින් කාබනික වගාව ප්‍රචලිත කිරීම හා දිරිගැන්වීමට අවශ්‍ය ව්‍යාප්ත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලැබීම අනිවාර්ය අවශ්‍යතාවයක් වන අතර ඒ මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීමටත් , වැඩි විදේශ විනිමයක් ඉපයීමටත් බලාපොරොත්තු වේ.

- කරුංකා අපනයනය විධිමත් කිරීම

  කරුංකා අපනයන විධිමත් කිරීම සඳහා අපනයනකරුවන් හට නිසි ක්‍රමවේදයක් හඳුන්වාදීම, අපනයනකරුවන්ගේ වාර්තා විශ්ලේෂණය හා ඇගයීම් කටයුතු සිදු කිරීම, කරුංකා අපනයනය විධිමත් කිරීම සඳහා එක් එක් සමාගම් වෙත අපනයන ප්‍රමාණ ලබා දීම, අපනයනකරුවන්ගේ සැපයුම් ජාලය අධීක්ෂණය හා වාර්තා සම්පාදනය කිරීමට ව්‍යාපෘති

ඒකකය මඟින් කටයුතු කරනු ලැබේ. එමෙන්ම කරුංකා ප්‍රතිඅපනයන සඳහා අවශ්‍ය නිර්දේශ, කුළුබඩු ආශ්‍රිත සැපයුම්කරුවන් / සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු මෙන්ම අපනයන ක්‍රමවේදය, ව්‍යාපාර ප්‍රවර්ධනය, අලෙවිකරණය, ව්‍යවසාය සංවර්ධනය ආදී ව්‍යාපාර සඳහා අත්‍යාවශ්‍ය වන තාක්ෂණික කරුණු පිළිබඳ මහපෙන්වීම, පුහුණු වැඩසටහන් සංවිධානය, මෙහෙයවීම, ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විවිධ වාර්තා පාර්ශවකරුවන් වෙත ලබා දීම මඟින් ඉදිරියේදී කරුංකා අපනයනය විධිමත් කරලීමට බලාපොරොත්තු වේ.

- අලුතින් හඳුන්වා දුන් EAC ප්‍රභේදවල ශාක නිෂ්පාදනය වැඩි කිරීම
- මව් ශාක උයන ස්ථාපිත කිරීම.
- අලුතින් සංවර්ධනය කරන ලද අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීම.
- රසායනාගාරවල යටිතල පහසුකම් වැඩි කිරීම.
- කෝපි, කොකෝවා සහ වැනිලා පිළිබඳ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම.
- රසායනාගාර සඳහා ප්‍රතීතන සහතික ලබා ගැනීම.

ඒ.පී.පී. දිස්නා

අධ්‍යක්ෂ ජනරාල්

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඒ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු
95 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

පරිච්ඡේදය 03

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා


ඒ.සී.ඒ -එෆ්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	තත්‍ය 2023	2022	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1			
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	2			ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3			
-	බදු නොවන ආදායම් හාවෙනත්	4			
-	මුළු ආදායම් ලැබීම් (අ)				
-	ආදායම් නොවන ලැබීම්				
1,227,512,780	භාණ්ඩාගාර අග්‍රිම		1,272,125,000	1,633,160,000	ඒසිඒ-3
	තැන්පතු		239,124,066	86,978,491	ඒසිඒ-4
35,000,000	අත්තිකාරම් ගිණුම්		48,021,175	40,885,228	ඒසිඒ-5/5(ඒ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
1,262,512,780	මුළු ආදායම් නොවනලැබීම් (ආ)		**1,559,270,241**	**1,761,023,719**	
1,262,512,780	මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,559,270,241**	**1,761,023,719**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		21,496,362	119	
1,262,512,780	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්ඉ=(අ)+(ආ)		1,537,773,879	1,761,023,600	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
762,900,000	වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	744,889,990	696,666,692	
89,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	81,163,045	59,250,320	ඒසිඒ-2(ii)
15,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	12,995,560	14,924,175	
	පොළී ගෙවීම්	8			
	වෙනත් පුනරාවර්තනවියදම්	9			
867,900,000	මුළු පුනරාවර්තනවියදම් (ඊ)		839,048,595	770,841,187	
	මූලධන වියදම්				
22,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම්	10	22,269,232	14,455,901	
5,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,146,346		
400,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	387,697,746	240,853,621	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
1,500,000	හැකියා වර්ධනය	14	792,433	789,075	
8,000,000	වෙනත් මූලධන වියදම්	15	6,412,910	8,221,318	
437,000,000	මුළු මූලධන වියදම් (උ)		421,318,667	264,319,915	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)				
	තැන්පතු ගෙවීම් 14		315,896,357	2,555,937	ඒසිඒ-4
40,000,000	අත්තිකාරම් ගෙවීම්		46,797,548	43,604,499	ඒසිඒ-5/5(ඒ)
40,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		362,693,905	46,160,436	
1,344,900,000	මුළු වියදම් එ= (ඊ+උ+ඌ)		1,623,061,167	1,081,321,538	
-	…2023..දෙසැම්බර් 31 දිනට ශේෂය= (ඉ-එ)		(85,287,288)	679,702,062	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(85,287,288)	679,702,062	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ-3

3.2 .මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.



ඒඩිල්.පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023 රු	2023 රු
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඩිඒ-6	1,448,474,901.52	1,107,015,274.00
මූල්‍ය වත්කම්			
ආන්ඩුකාරගේ ආයුකම්	ඒඩිඒ-5/5(ඒ)	128,977,569.00	130,201,196.20
ශුද්ධ හා මූදල් සමාන දෑ	ඒඩිඒ-3	-	-
මුළු වත්කම්		1,577,452,470.52	1,237,216,470.00
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
සාමාජිකයාගේ කවන ශුද්ධ වත්කම්		129,121,783.85	45,573,..20.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,448,474,901.52	1,107,0..5,274.00
කෘති හා වැඩ ආන්ඩුකාරගේ සංවිතය	ඒඩිඒ-5(ඒ)		
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	ඒඩිඒ-4	9,853,785.15	86,628,076.00
අල්ප බැංකුව	ඒඩිඒ-3	-	-
මුළු වගකීම්		1,577,452,470.52	1,237,216,470.00

මිවු අංක ...01.....සිට ...38..... දක්වා ඒකීය ඒකීය ; මිට ඒකීය ; දක්වා වූ ඇතැති ආදායම් ප්‍රකාශනය සහ ආදායම් ගිණුමේ ආකාරයෙන් සහ ගැලපුම් විවු අංක ...39.... සිට ...58.... දක්වා ඇතුලත් ගිණුම්වල සටහන් විශ්වාස ද බෙදී සවසයි ගිණුම්වලින් අවධාරණය කොට ඇති. යම්කි මූල්‍ය ප්‍රකාශනය සිදුවෙලා ඇති ආයතනයේ ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීම් සඳහා අදාළ ප්‍රමිතිවලට පනතකවූවි සිදුකර ඇති අතර සමාගම් මූල්‍ය ප්‍රකාශනයන්හි සංසන්දනාත්මක තොරතුරු ඇතුළත් කිරීම් සඳහා අදාළ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇත. මෙහි අදාළ ගිණුම් සටහන් සහ අනෙකුත් ගිණුම් තොරතුරු සාමාජිකයාගේ ගිණුම් සෙවී සමඟ සැසඳීම් සඳ ඇති බවනාත් ඒවා සංබාධා සමඟ එකඟ වන බවවත්

මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම් අභ්‍යන්තර පාලන සද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවත්වා ගැනීම සඳහා අදාළ ප්‍රමිතියක් වාර්තාකරණ ආයතනය තුළ පවත්වා ගැනීම සඳහා අදාළ ප්‍රමිතියක්

.....2023-12-31..... දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්‍ය 2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	101,548,526	87,252,987
අග්‍රිම ලැබීම	1,272,125,000	1,633,160,000
අත්තිකාරම් අයකර ගැනීම	49,036,854	42,257,699
තැන්පතු ලැබීම්	239,124,066	86,978,491
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,661,834,447**	**1,849,649,177**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	822,708,145	1,026,338,882
සහනාධාර සහ මාරුකිරීම්	12,995,560	5,770,416
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	27,738,095	771,379,325
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	21,496,362	119
අත්තිකාරම් ගෙවීම්	46,595,756	43,604,499
තැන්පතු ගෙවීම්	315,896,357	2,555,937
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,247,430,275**	**1,849,649,178**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**414,404,172**	**(1)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
පොළී		-
ලාභාංශ		-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්		
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්	**414,404,172**	
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		
(ඉ)	-	-
ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**414,404,172**	**(1)**
මූල්‍ය ක්‍රියාකාකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	
විදේශීය ණය ගැනීම්	-	
ප්‍රදානයන් ලැබීම්	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		
		-
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ලෙවීම්	-	-
විදේශීය ණය ආපසු ලෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	අවසන් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	ප්‍රමාණය (රු.) (මිලියන)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	රජයේ ගොඩනැඟිලි කුලී	2900	2900	2681.3	92.5
2002-02-99	ණය පොලිය - අනෙකුත්	5500	5500	5172.4	94.0
2003-01-00	විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකිණීම්	15000	35000	43263.1	123.6
2003-02-99	විකුණුම් හා ගාස්තු- පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	1000	250	23.8	9.5
2003-99-00	විකුණුම් හා ගාස්තු- අනෙකුත් ලැබීම්	5000	3000	4910.3	163.7
2006-02-02	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත්	200	200	177.6	88.8

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු, 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	854,000	867,900	839,048.6	96.7
ප්‍රාග්ධන	437,000	437,000	421,318.7	96.4
එකතුව	1,291,000	1,304,900	1,260,367.3	96.6

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු, 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	වැවිලි අමාත්‍යාංශය	135-2-3-47-2507	34049.8	23900.0	22152.5	92.7

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	539,750.0	539,750.0		
9152	යන්ත්‍රෝපකරණ	326,783.7	325,783.7		
9153	ඉඩම්	582,941.2	582,941.2		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපති වාර්තාව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | සිපිසිජී/කේඩී/එන්/සීරීඒ/සි/2024/16 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date | 2023 මැයි 17 දින.

ගණන්දීමේ නිලධාරී,
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සමඟ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.ඒ.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අවිසිජී/ක්‍රෝඩී/එප්/ඩීරීජ්/සි/2024/16 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 17 දින

ගණන්දීමේ නිලධාරී,
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 17 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදි එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම්.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දෙපාර්තමේන්තුව සතු රු.3,000,000 ක ඉඩම් , එකතුව රු.7,728,000 ක ගොඩනැගිලි දෙකක් හා රු.720,000 ක වාහන 12 ක් මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.3,380,950 ක් වැය කර අවස්ථා 09 කදී මිලදීගත් ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.6.2. අග්‍රිම ශේෂය

දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගිණුම (ඒසීඒ-03) අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂයක් නොතිබුණද භාණ්ඩාගාර පරිඝණක මුද්‍රිත සටහන් (එස්ඒ - 70) අනුව රු.21,496,362 ක ශේෂයක් පැවතුණි.

1.6.3 ලේඛන හා සොත්පත් පවත්වා නොතිබීම

මාතලේ දිස්ත්‍රික් කාර්යාලය සහ මාතලේ මධ්‍යම පැළ තවාන වෘක්ෂලතා ලේඛනයද, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය ඵලදා ලේඛනයද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පැවතුණි.

නීති , රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ) පාර්ලිමේන්තු පනත්		
1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ 15 වගන්තිය	289,964,900	අමාත්‍යවරයා විසින් නියෝග සැදීමෙන් පසුව කෘෂිකාර්මික භෝග වගාකරන සහ සකස් කරන තැනැත්තන්ට සහනාධාර සහ මූල්‍යමය හෝ වූ වෙනත් ආධාර ප්‍රධානය කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු වුවද , අමාත්‍යවරයා විසින් නියෝග සැදීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල අපනයන ප්‍රවර්ධන ආධාර ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
XII පරිවර්ජේදයේ 1.3 වගන්තිය	-	නිවාඩු ලබා ගැනීමට දින 07 කට පෙර නිවාඩු අනුමත කරන බලධාරියා වෙත නිවාඩු ඉල්ලුම්පත් ඉදිරිපත් කර නිවාඩු අනුමත කරගත යුතු වුවත් මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරින් නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත් සියල්ල මාස 2 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
i. මුදල් රෙගුලාසි 177	1,218,365	රැස්කරන මුදල් දිනපතා හෝ හැකිතාක් කලින් බැංකුගත කිරීමට සැලැස්විය යුතු වුවත් , නියැදි පරීක්ෂාවට අනුව දෙපාර්තමේන්තුවේ ආයතන 14 ක රැස්කරන ලද මුදල් 2023 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුල අවස්ථා 41 කදී දින 5 ත් දින 44 ත් අතර කාලයක් ප්‍රමාද වී බැංකුගත කර තිබුණි.
ii. මුදල් රෙගුලාසි 395 (ඇ)	-	දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් 02 කට අදාළව අවස්ථා 12 කදී දින 15 සිට දින 31 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2015 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ භෝග වර්ග 12 ක් ප්‍රවර්ධනය කිරීමට රු.400,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර සමාලෝචිත වර්ෂය තුළ රු.387,697,746 ක් වැය කර තිබුණි. ඊට අදාලව වර්ෂය තුලදී බෝග වර්ග 12 කට අදාළ පැළ ගොවීන් වෙත බෙදා හැර තිබුණි. මේ අතුරින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පැළ 622,226 ක් ගොවීන් වෙත බෙදා දී තිබුණු අතර ඒ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ 03 ක නියැදි පරීක්ෂාවට භාජනය වූ ගොවීන් 10 දෙනෙකු වෙත ලබා දී තිබූ ගම්මිරිස් පැල 9,580 ක් අතරින් පැළ 4,240 ක් විනාශ වී තිබුණි. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයට අදාළව ගම්මිරිස් හා කෝපි පිළිවෙලින් 2,890 ක් හා 600 ක් ලබා දී තිබුණ ද ඉන් ගම්මිරිස් හා කෝපි පැළ පිළිවෙලින් 1,225 ක් හා 598 ක් විනාශ වී තිබුණි. එමෙන්ම පැළ නඩත්තුවකින් තොරව පැවතීම, ප්‍රමාණවත් කාලයක් පසු විපරමක් නොකිරීම නිරීක්ෂණය වන අතර ඒ හේතුවෙන් පරීක්ෂණයට භාජනය වූ බෝග ප්‍රවර්ධනය සියයට 54 ක් පමණ වූ අඩු ඵලදායිතාවයකින් පැවතුණි.

(ආ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පර්යේෂණ සඳහා සමාලෝචිත වර්ෂයේ රු10,000,000 ක ප්‍රතිපාදනය වෙන් කර ඉන් රු. 6,410,734 ක් වර්ෂය තුළ වැය කර තිබුණි. එයින් මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා රු. 5,703,092 ක ප්‍රතිපාදනයක් වෙන් කර සමාලෝචිත වර්ෂයේදී රු.3,607,811 ක් වැය කර තිබුණි. මාතලේ පර්යේෂණායතනයේ කුරුදු සම්බන්ධ සිදු කල පර්යේෂණයකට අනුව සීනි වෙනුවට කුරුදු යොදා ගෙන බිස්කට් නිෂ්පාදනය කල හැකි බව නිගමනය කර තිබුණද ඒ සම්බන්ධව නිෂ්පාදකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම රු.730,000 ක් වැය කර ගම්මිරිස් සම්බන්ධ පර්යේෂණ 04 ක් ක්‍රියාත්මක කර වියළි කළ ගම්මිරිස් සඳහා පයිපෙරීන් නිස්සාරණය කිරීම් සඳහා ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ වගා කරන ගම්මිරිස් ප්‍රදේශ අනුව එහි ගුණාත්මක බව වෙනස් වන ආකාරය විශ්ලේෂණය කිරීම සිදු කර තිබුණද ඒ සම්බන්ධව මහජනතාව මෙන්ම ගම්මිරිස් ගොවීන් වෙත සන්නිවේදනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.1.3. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

මාතලේ පර්යේෂණ ආයතනයේ පැළ තවානෙහි පොලිතින් ගෘහයක් ඉදිකිරීම සඳහා 2021 දෙසැම්බර් 29 දින රු.420,031 ක් වැය කර අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අදාළ ඉදිකිරීම් සිදු නොකර ද්‍රව්‍ය ගබඩා කර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

ප්‍රහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 387 ක ඉඩම් කොටස් 31 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයිතිය පවරාගෙන නොතිබුණි.

(ආ) තක්සේරු වටිනාකමෙහි එකතුව රු.4,850,000 ක වාහන 05 ක් වසර 2-4 ක් අතර කාලයක සිට නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව ප්‍රධාන කාර්යාලයේ හා මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ ගාල් කර තිබුණි.

(ඇ) 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලබාගත් තොරතුරු වලට අනුව දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම ක්‍රියාත්මක වන පැළ තවාන් 12 ක නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතා මට්ටම පැළ 3,005,000 වූ අතර නිෂ්පාදන ඉලක්කය 2,104,508 ක් වී තිබුණි. ඒ අතරින් පැළ නිෂ්පාදනය 1,829,144 ක් විය. එම කාලය තුල සහතික කල පැළ 1,560,005 ක් වුවද ක්ෂේත්‍රයට නිකුත් කළ පැළ ප්‍රමාණය 1,514,813 ක් විය. දෙපාර්තමේන්තුව යටතේ පවතින කුණ්ඩසාලේ සහ නිල්ලඹ පැළ තවාන්වල උපරිම අපනයන බෝග පැළ නිෂ්පාදන ධාරිතාවය වාර්ෂිකව පැළ 250,000 ක් වුවද වාර්ෂික නිෂ්පාදනය පැළ 65,026 ක් එනම් සියයට 26 ක් තරම් අඩු මට්ටමක පැවතුණු අතර පැළ ඉලක්කයට සාපේක්ෂව ක්ෂේත්‍රයට පැළ නිකුත් කිරීම සියයට 44 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. එසේම අනෙකුත් රජයේ පැළ තවාන් 10 උපරිම ධාරිතාවයට සාපේක්ෂව පැළ නිෂ්පාදනය සියයට 61 මට්ටමක පැවතුණි.

(ඉ) මුල්හාල්කැලේ මධ්‍යම පැල තවානේ ඉඩම් අක්කර 4.2 ක් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි.

(ඊ) මාතලේ මධ්‍යම පැළ තවාන සඳහා 2021 වර්ෂයේදී රු.111,600 කට මිලදී ගත් ලීටර් 5000 වතුර ටැංකි 02 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ අපේක්ෂිත අරමුණට යොදාගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

3.3. මූල්‍ය අනුමිකතා ස්වරූපයේ ගණුදෙනු

මුල්හාල්කැලේ මධ්‍යම පැළ තවානේ රු. 470,745 ක ද්‍රව්‍ය ඌණතාවයක් පැවතියද ඒ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4. පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිලියෙල කල මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.903,544 ක පාඩු හා හානි 17 ක් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් තිබියදී 2022 මැයි මස සිට වසරක කාලයක් සඳහා මසකට කිලෝමීටර් 3,000 ක් ධාවනය කිරීමේ පදනම මත මාසිකව රු.178,000 ක කුලියකට වාහනයක් ලබා ගෙන තිබුණි. ඒ අනුව වර්ෂය තුල කිලෝමීටර් 36,000 ක් ධාවනය කළ යුතු වුවත් එම කාලය තුළ කිලෝමීටර් 18,020 ක් ධාවනය කිරීමෙන් කිලෝමීටර් 17,980 ක් ඌණ උපයෝජනය කර ඒ වෙනුවෙන් රු.1,066,813 ක පිරිවැයක් නිශ්කාර්යයව ගෙවා තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී" ශිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන් 03 කගෙන් වසර 3 ක් 5 ක් අතර කාල පරාසයක සිට එකතුව රු.95,462 ක ණය ශේෂයක් හා සේවය හැර ගිය නිලධරීන් 06 ක්ගෙන් වසර 04 සිට 20 දක්වා කාලයක සිට පැවත එන රු.464,145 ක ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව වාහන වලට අවශ්‍ය ටයර් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු.2,416,265 ක ටයර් 50 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඉන් රු.1,812,231 ක ටයර් 35 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 02 ක වාර්ෂික ද්‍රව්‍ය අවශ්‍යතාවය නිශ්චිතව හඳුනානොගෙන මිලදී ගත් රු.2,294,000 ක වටිනාකමකින් යුත් බඳුන් මාධ්‍යය කියුබ් 102 ක් සමාලෝචිත වර්ෂය තුල භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 166 ක පුරප්පාඩු පැවති අතර තනතුරු 24 ක් අතිරික්තව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 24 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තු කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) දිස්ත්‍රික් / විෂයානුබද්ධ ව්‍යාප්ති නිලධාරී තනතුරු 13 ක් හා ව්‍යාප්ති නිලධාරී තනතුරු 34 ක පුරප්පාඩු පැවතීම ක්ෂේත්‍ර කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

එච්.ජී.ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1.ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන

2023 වසරේදී , මහා භාණ්ඩාගාරය මඟින් අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන් රු.මි. රු.මි. 390.00 ක ප්‍රතිපාදන වලින් වගා වපසරිය වැඩි කිරීම, මධ්‍යම පැළ තවාන් සංවර්ධනය, ඵලදායීතාවය ඉහළ නැංවීම , අගය එකතු කිරීමේ වැඩසටහන , සන්නිවේදන වැඩසටහන් , ධාරිතා වර්ධන වැඩසටහන , පරිපාලන වියදම් හා 2022 වසරේ අතැති බිල්පත් ගෙවීම් ඇතුලත්ව රු.මි. 381.30 ක් සංවර්ධන වැඩසටහන් සඳහා වැය විය.

වැඩසටහන	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	ඉලක්ක
වගා වපසරිය ඉහල නැංවීමේ වැඩසටහන	210.97	• නව වගා හෙක්ටයාර - 1520 • කුඩා පරිමාණ ගෙවතු පැළ -561,000 • අපනයන බෝග ප්‍රවර්ධන සඳහා පැළ - 79,300 • පොකුරු ගම්මාන වැඩසටහන යටතේ පැළ -176,150 • පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන - පුවක් පැළ 100,000
මධ්‍යම පැළ තවාන් සංවර්ධනය	18.00	• පුවක් බීජ - 40,000 • කුරුඳු බීජ - කි.ග්‍රෑම් 3,500 • කරඳමුංගු බීජ - කි.ග්‍රෑම් 50 • සාදික්කා බීජ - 10,000 • බඳුන් මාධ්‍ය - කියුබ් 625 • ජල සම්පාදන පද්ධති - 02
අපනයන කෘෂිභෝග ඵලදායීතාව ඉහල නැංවීමේ වැඩසටහන	32.06	• පාළු පැළ ලබාදීම- හෙක්ටයාර - 1090 • සත්ත්ව හානි වැලැක්වීම - ඒකක 25 • ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති - ඒකක 10
අගය එකතු කිරීමේ වැඩසටහන	36.50	• කාබනික ගම්මාන (කුරුඳු) හෙක්ටයාර - 15 • පසු අස්වනු තාක්ෂණික උපකරණ - ඒකක 100 • මෘදුකාංග සංවර්ධනය - 02 • GMP / GAP / ISO / BRC - 05 • පාර්ශ්වකරුවන් ලියාපදිංචිය- 50,000 • ව්‍යවසාය සංවර්ධනය - ප්‍රතිලාභීන් 225
ජනමාධ්‍ය සහ සන්නිවේදනය	23.88	• ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය - 100 • අත්පත්‍රිකා, පෝස්ටර් - 300,000 • තාක්ෂණික පොත් මුද්‍රණය - 30,000 • ප්‍රදර්ශන -04 • තොරතුරු සන්නිවේදනය 10,000
කුසලතා සංවර්ධනය	14.16	• ගොවි පුහුණු 1,585 • ක්ෂේත්‍ර දින 160 • මාතලේ සේවාස්ථ පුහුණු වැඩසටහන්-40 • කුරුඳු පුහුණු වැඩසටහන් ,මාතර කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය - 120 • ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන් -32
පරිපාලන වියදම්	10.20	
2022 වසරේ අතැති බිල්පත් ගෙවීම්	44.23	
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	390.00	

2023 වසරේ ක්‍රියාත්මක සැලැස්මට අනුව, වගා ව්‍යාප්ති වැඩසටහන යටතේ නව වගා, කුඩා ගෙවතු වැඩසටහන, අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන, පොකුරු ගම්මාන වැඩසටහන, කහ සහ ඉඟුරු වගා වැඩසටහන හා පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී.

2023 වසරේදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද නව වගා සංවර්ධන වැඩසටහන යටතේ කුරුඳු හෙක්ටයාර 785.41, ගම්මිරිස් හෙක්ටයාර 371.65 ක්, ඇරබිකා කෝපි හෙක්ටයාර 180.04 කොකෝවා හෙක්ටයාර 40.90 ක් කරඳමුංගු හෙක්ටයාර 7.4 ක වගා වපසරියක නව වගාවන් සිදු කරන ලදී. 2023 වසරේදී සමස්ත ඉලක්ක ගත වගා වපසරිය වූ හෙක්ටයාර 1520 න් සම්පූර්ණ කරන ලද සමස්ත නව වගා වපසරිය හෙක්ටයාර 1385.4 ක ප්‍රමාණයක් විය.

කුඩා පරිමාණ ෙගවතු වගා වැඩසටහන යටෙත් ගම්මිරිස් පැළ 168,114 ක්, කුරුඳු පැළ 310,686 ක්, ගොරකා පැළ 12,096 ක් හා කෝපි පැළ 38,195 ක් ඇතුළුව සමස්ත පැළ 529,091 ක් පැළ ලබා දෙන ලදී. 2023 වසරේදී මෙම වැඩසටහන යටතේ ඉලක්කගත පැළ ප්‍රමාණය 561,000 ක් විය.

රාජ්‍ය ආයතන , විවිධ ආයතන හා කුඩා ප්‍රමාණයෙන් ගෙවතු වගා සඳහා පැළ ලබා දීමේ අරමුනින් යුතු වූ අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ ගම්මිරිස් පැළ 17,772 ක්, කුරුඳු පැළ 40,914 ක් හා කෝපි පැළ 300 ක් ලබා දීමට හැකිවිය. ලබා දුන් සමස්ත පැළ ප්‍රමාණය 58,986 ක් වූ අතර 2023 වසරේ එම වැඩසටහන යටතේ ලබා දීමට අපේක්ෂිත පැළ ප්‍රමාණය 79,300 ක් විය.

ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් ඒකාබද්ධ කොට පොකුරු ගම්මානයක් ලෙස ස්ථාපනය කර එම ගම්මාන කණ්ඩායමක් ලෙස සංවිධානය කර පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවිකරන අවස්ථාව දක්වා ක්‍රමවත් සැලැස්මක් සකස්කර ගොවීන් සවිබල ගැන්වීමට සහ වෙළඳපල සම්බන්ධීකරණයට කටයුතු කරනු ලැබීය. මේ යටතේ පැඟිරි, කෝපි සහ කරඳමුංගු පැළ ලබා දෙන ලදී. මේ යටතේ පැඟිරි හා ලෙමන් ග්‍රාස් පැළ 143,275 ක්, රොබස්ටා කෝපි පැළ 17,871 ක් කරඳමුංගු පැළ 2,000 ක් හා කරාඹු පැළ 400 ක් ගොවීන් අතර බෙදා දෙන ලද අතර, බෙදා දුන් සමස්ත පැළ සංඛ්‍යාව 163,546ක් විය. 2023 වසරේ පොකුරු ගම්මාන වැඩසටහන යටතේ පැළ 176,150 ක් ලබා දීමට අපේක්ෂා කරන ලදී.

2023 වසරේ කහ සහ ඉඟුරු වගා වැඩසටහන යටතේ ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පමණක් පවත්වන ලදී.

පරිසර සංරක්ෂණය හා පුවක් අපනයන කිරීම වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පැළ මිලියනයක ඉලක්කගත පුවක් පැළ ප්‍රමාණයෙන් පැළ 968,300 ක් ලබා දෙන ලදි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය වාර්ෂික පැළ අවශ්‍යතාවය, ඍජුවම පවත්වා ගෙන යන පැළ තවාන් 12ක් මඟින් හා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් මඟින් සපුරා ගනු ලබයි. මධ්‍යම පැළ තවාන් සඳහා අවශ්‍ය යටිතල

පහසුකම් සැපිරීම, රෝපණ ද්‍රව්‍ය හා රෝපණ මාධ්‍ය සැපයීමේ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන අතර, 2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මධ්‍යම පැළ තවාන් වල පැළ නිෂ්පාදනය පැළ 1,661,052 ක් විය.

දෙපාර්තමේන්තු මධ්‍යම පැළ තවාන් සඳහා පුවක් බීජ 89,223, සාදික්කා බීජ 4,587 ක්, කුරුඳු බීජ කි.ග්‍රෑම් 3,300 ක් මිලට ගන්නා ලදී. එසේම 2023 වසර සඳහා මධ්‍යම පැළ තවාන්වලට අවශ්‍ය සෙවණ දැල් ඇතුළු උපකරණ මිලට ගන්නා ලදී. පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඳුන් මාධ්‍ය කියුබ් 461 ක් මිලට ගන්නා ලද අතර, ගස්නාව පැළ තවානේ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

පවතින වගාවන්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ වගා ඒකක භූමි ප්‍රමාණයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමට අපේක්ෂා කරන ලදී. 2023 වසරේදී ද මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, මේ යටතේ කුරුඳු හෙක්ටයාර 797.6 ක්, ඇරබිකා කෝපි හෙක්ටයාර 31.10 ක් , ගම්මිරිස් හෙක්ටයාර 295.77 ක්, කොකෝවා හෙක්ටයාර 8.6 ක් ඇතුළුව හෙක්ටයාර 1133.07 ක් සඳහා අවශ්‍ය පැළ ලබා දෙන ලදි.

වන සතුන්ගෙන් වන හානි වලක්වා ගැනිම සඳහා පළිබෝධ පාලන ඒකක 16 ක් හා කාලගුණික වෙනස්කම් වලින් භෝගයන්ට වන හානි වලින් වගාවන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 50% ක පිරිවැය දරමින් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ඒකක 08 ක් වගාකරුවන් වෙත සපයන ලදි.

අපනයන කෘෂි බෝග කාබනික වැඩසටහන යටෙත් ගම්පහ දිවුලපිටිය කාබනික ගම්මානයක් සඳහා කාබනික සහතිකය ලබා දෙන ලදී.

අගය දාම සංවර්ධන වැඩසටහන් යටතේ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන යටතේ වැඩසටහන් 03 ක් හා අපනයන කෘෂි බෝග සඳහා වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ලබාගැනීමට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්වලින් GAP සහතික ලබාගත් සංඛ්‍යාව 102 කට සහතික ලබා දෙන ලදී. තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ISO 22000/HACCP සහතිකය සැකසුම් මධ්‍යස්ථාන දෙකකටත් ,GMP සහතිකය මධ්‍යස්ථාන තුනකටත් ලබාදෙන ලදී. වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන යටතේ වැඩසටහන් 03 ක් පැවැත්වීමට හැකි වූ අතර. අගයදාම සංවර්ධන වැඩසටහන යටතේ පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම මඟින් පාර්ශ්වකරුවන් 31,500 ක් ලියාපදිංචි කටයුතු සිදු කරන ලදී. අගය දාම සංවර්ධන වැඩසටහන යටතේ පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය මඟින් පසු අස්වනු උපකරණ 117 ක් සඳහා ආධාර ලබාදෙන ලදි.

අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත පාශ්වකරුවන් මෙන්ම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා සන්නිවේදන වැඩසටහන් රැසක් 2023 වසරේදි ක්‍රියාත්මක කරනු ලැබීය.ඒ යටෙත් ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන් . මුද්‍රිත මාධ්‍ය . තොරතුරු කේන්ද්‍රය, 1920 කෘෂි සේවා තොරතුරු , වෙබ් අඩවි, facebook, You Tube, Telegram සහ Whatsapp වැනි සමාජ මාධ්‍ය ජාලා මඟින් ද

අපනයන කෘෂි බෝග තොරතුරු පාර්ශ්වකරුවන් අතර සන්නිවේදනය කරන ලදී. තොරතුරු කේන්ද්‍රය,1920 කෘෂි උපදේශන සේවාව හා වෙබ් අඩවිය හා ප්‍රදර්ශන මඟින් අවශ්‍ය අපනයන කෘෂි බෝග තාක්ෂණික දැනුම ලබා දී ඇත.

ධාරිතා වර්ධන වැඩසටහන යටතේ ගොවි පුහුණු, ක්ෂේත්‍ර දින, මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්, කුරුඳු පුහුණු වැඩසටහන් හා මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
වගා කරන ලද නව වගා හෙක්ටයාර් ප්‍රමාණය	91.14		-
කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව	94.31	-	-
අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව		74.38	
පොකුරු ගම්මාන වැඩසටහන සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව	92.84		
පුවක් ප්‍රවර්ධන වැඩසටහන යටතේ නිකුත් කරන ලද පුවක් පැළ සංඛ්‍යාව	96.83		
සංවර්ධනය කරන ලද මධ්‍යම පැළ තවාන් සංඛ්‍යාව			72.64
මිලදී ගන්නා ලද බඳුන් මාධ්‍ය මිලදී ගැනීම්			73.76
පාළු පැළ සිටුවීම මඟින් ඵලදායිතාවය ඉහළ නංවන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)	103.95		
ස්ථාපිත කරන ලද ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති ප්‍රමාණය		80	
ස්ථාපිත කරන ලද සත්ව හානි වැටවල් ප්‍රමාණය	-		64
ස්ථාපනය කරන ලද ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති		80	
කාබනික අපනයන වගා හෙක්ටයාර ප්‍රමාණය	100		-
බෙදා හරින ලද පසු අස්වනු තාක්ෂණ උපකරණ ප්‍රමාණය	117		
වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන්	150		
GAP හා අනෙකුත් සහතිකකරණය		75	
පාර්ශ්වකරුවන් ලියාපදිංචිය			63
ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්	112		
අපනයන කෘෂිකර්ම මාධ්‍ය	96.79		
ගොවි පුහුණු	122.40		
ක්ෂේත්‍ර දින වැඩසටහන්	135		
සේවාස්ථ පුහුණු වැඩසටහන්			72.5
කුරුඳු තැලුම් පුහුණු වැඩසටහන්		75.83	

පර්යේෂණ අංශය 2023 වර්ෂය තුළ දැනුම බෙදා හැරීමේ වැඩසටහනක් පවත්වා ඇත. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ EAC පිළිබඳ පුහුණු වැඩසටහන් 30 ක් පවත්වන ලදී. කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සහ IBRS නාරම්මල පිළිවෙළින් පුහුණු වැඩසටහන් 86ක් සහ 11ක් පවත්වන ලදී.

මාතලේ මධ්‍යම පර්යේෂණ ස්ථානයේ නිලධාරීන් මාර්ගගත වැඩසටහන් 22 ක් සහ ජන මාධ්‍ය වැඩසටහන් 36 හරහා තාක්ෂණ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය.

2022 වර්ෂය තුළ යහපත් කෘෂිකාර්මික භාවිතයන් සහතික කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩසටහන් 15 ක් පිළිබඳ විගණනය සඳහා මාතලේ මධ්‍යම පර්යේෂණ ස්ථානයේ නිලධාරීන් සහභාගී විය.

අපනයන කෘෂිකාර්මික භෝග සඳහා පර්යේෂණ ගරු කිරීම සහ අපනයන කෘෂිකාර්මික භෝග වලින් උපරිම නිෂ්පාදනය සහ ඉහළ ගුණාත්මක බව අවධාරණය කරන ලද ශාක ආරක්ෂණ වැඩසටහන.පර්යේෂණ මධ්‍යස්ථාන අටක ක්‍රියාකාරීත්වය තුළින් මෙම ඉලක්කය සපුරා ගන්නා ලදී.

“අපනයන කෘෂිකාර්මික භෝගවල ඵලදායිතාව සහ ගුණාත්මක වර්ධනය සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත්” යන තේමාව යටතේ 2023 ජුනි 22 සහ 23 යන දිනවල වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව පවත්වන ලදී.මෙහිදී පර්යේෂණ පත්‍රිකා 25ක් ප්‍රකාශයට පත් කර ඇත.

රසායනාගාර ප්‍රතීතනය

NCRTC හි පාංශු හා පැලෑටි පෝෂණ රසායනාගාරය සහ පසු අස්වනු තාක්ෂණ රසායනාගාරය ප්‍රතීතනය ලබා ගැනීම සඳහා අවසාන තක්සේරුවSLAB විසින් මෙහෙයවන ලදි.

මෙම රසායනාගාර අපනයනවල ගුණාත්මකභාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මේ වසරේ පමණක් පරීක්ෂණ වාර්ථා3300 කට වඩා වැඩි ප්‍රමාණයක් නිකුත් කොට ඇත.

මාතලේ පසු අස්වනු තාක්ෂණ රසායනාගාරය ප්‍රතීතනය සඳහා ක්‍රියාකාරකම් සිදුකළ අතර SLAB ආයතනය විසින් ඇගයීම සාර්ථකව සිදු කරන ලදි. ඊට අමතරව SLSI විසින් විද්‍යාගාර උපකරණ ක්‍රමාංකනය සිදු කරන ලදී.

4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම් , අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්

අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන හා අපනයන කෘෂි බෝග පර්යේෂණ සහ ඒකාබද්ධ රෝග හා පළිබෝධ කළමණාකරණ (IPM) වැඩසටහන යන වැඩසටහන් 02 යටතේ ගොඩනැඟිලි අළුත්වැඩියා, යටිතල පහසුකම් සංවර්ධනය හා නව ඉදි කිරීම් සඳහා රුපියල් මිලියන 25 ක ප්‍රතිපාදන 2023 වසර සඳහා වෙන් කරන ලදි. වෙන් වූ ප්‍රතිපාදන සඳහා අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ඒ යටතේ අපේක්ෂිත නිමැවුම 100% මට්ටමට ළඟා වීමට හැකි විය.

ඒ අනුව දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් 17ක් තුළ හා පර්යේෂණ මධ්‍යස්ථාන 07 ක් තුළ අත්‍යවශ්‍ය හා හදුනාගත් ව්‍යාපෘතින් ඒ ඒ වැය විෂයන් යටතේ පහත අයුරින් ක්‍රියාත්මක කරන ලදි.

වැය විෂය	දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන	පර්යේෂණ මධ්‍යස්ථාන තුළ ක්‍රියාතමක කරන ලද ව්‍යාපෘති ගණන
289-02-01-2001	24	13
289-02-01-2104	01	02
289-02-01-2506	12	06

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් වල නිමැවුම පහත පරිදි වේ.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
ගොඩනැඟිලි අළුත්වැඩියාවන් සම්පූර්ණ කළ ප්‍රමාණය	100		
සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රමාණය	100		
ඉදි කරන ලද නව ව්‍යාපෘති ප්‍රමාණය	100		

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. දෙපාර්තමේන්තුවට අදාලව හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු.

දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන තිරසර සංවර්ධන අරමුණු	ඉලක්ක	දර්ශකයන්ට අනුව ලබා ගත් ජයග්‍රහණ	ජයග්‍රහණ ලබා ගත් ප්‍රතිශතයන්		
			0%-49%	50%-74%	75%-100%
2.4.1.1.ඵලදායී හා තිරසාර කෘෂිකර්මාන්තය යටතේ අපනයන කෘෂිවගාවන්ගෙන් ආවරණයවන භූමි ප්‍රමාණය	නව්වගා වැඩසටහන (හෙක්) 1520	1385.40 හෙක්			91.14%
	කුඩා පරිමාණයේ ගෙවතු වගා වැඩසටහන (පැළ ලබා දීම) 561,000	529,091 පැළ			94.31
	අපනයන කෘෂි බෝග ප්‍රවර්ධන වැඩසටහන (පැළ ලබා දීම 79,300	58,986 පැළ		74.38	
	පොකුරු ගම්මාන වැඩසටහන (පැළ ලබා දීම)	163,546 පැළ			92.84
	ඉලෙක්ට්‍රොනික් මාධය 100 අත් පත්‍රිකා -300,000 තාක්ෂණික ප්‍රකාශන 30,000 ප්‍රදර්ශන -04 තොරතුරු සන්නිවේදන - 10,000	ඉලෙක්ට්‍රොනික් මාධ්‍යය -161 ප්‍රින්ටින්- 07 ප්‍රදර්ශන -11 තොරතුරු සන්නිවේදන -4796			96.79
	ගොවි පුහුණු වැඩසටහන් -1585	ගොවි පුහුණු වැඩසටහන් 1940			100
	අගය එකතු කිරීම හා අගය දාම සංවර්ධන වැඩසටහන ක්ෂේත්‍ර දින වැඩසටහන් -160	ක්ෂේත්‍ර දින වැඩසටහන්-216			100
17.11.1.1. විදේශීය වෙළඳපොල සඳහා වන දේශීය දායකත්වයේ කෘෂි අංශයෙන් අපනයන කෘෂිකර්ම අංශයේ කොටස	වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් - සේවාස්ථ පුහුණු වැඩසටහන් -40	සේවාස්ථ පුහුණු වැඩසටහන් - 29(මාර්ගගත- 68)		72.5	
	GAP සහතිකකරණය - කාබනික සහතික -03 වෙනත් සහතික - (GMP/ISO/BRC)-05	කාබනික සහතික-01 වෙනත් සහතික - (GMP/ISO/BRC)-03			75
	පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම - 50,000	31,500		63	
	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 225 ප්‍රතිලාභීන්	254 ප්‍රතිලාභීන්			112
	කුරුඳු පුහුණු වැඩසටහන් 120	කුරුඳු පුහුණු වැඩසටහන් 91			75.83

2.5.1.1. මධ්‍යකාලීන හෝ දිගු කාලීන සංරක්ෂණ පහසුකම් තුලින් සුරක්ෂිත කර ඇති අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රෙවිණි සම්පත් සංඛ්‍යාව	කුරුඳු සඳහා පර්යේෂණ -04, කහ-03,ගම්මිරිස් -05, කෝපි-02,එනසාල් -02,සාදික්කා-01,ඉඟුරු02,බුලත් -01, පුවක්- 01,ගොරකා -01 හා වැනිලා සඳහා පර්යේෂණ 01 ක්ද ලෙස පර්යේෂණ 23 ක් ක්‍රියාත්මක විය.	සොයාගැනීම් -7	30		
9.5.2. නව සොයාගැනීම් සහ ඉදිරියට යන පර්යේෂණ ගණන	පර්යේෂණ ගණන -168 ඉදිරියට යන පර්යේෂණ -87	නව සොයාගැනීම් -126			75

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ඵලදායී හා තිරසාර කෘෂිකර්මාන්තය අරමුණු කර ගනිමින් අපනයන කෘෂි බෝග වගාවන් ස්ථාපනය කරන ලදී. මේ යටතේ අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය කෙරෙහි පාර්ශ්වකරුවන් ආකර්ෂණය කර ගැනීම , ගොවීන්ගේ වගා වපසරිය ඉහළ නැංවීම මෙන්ම අපනයන භෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ ආදායම් ඉහළ නැංවීම තුලින් ආර්ථිකය ඉහළ නංවාලීම සඳහා අපනයන කෘෂි බෝග නව වගා වපසරිය හෙක්ටයාර 1385.4 ක ප්‍රමාණයක් නව වගාවන් ලෙස ආරම්භ කරන ලදී. අපනයන කෘෂි බෝග වගාවන්ට නිරන්තයෙන් සිදුවන කාලගුණික හා දේශගුණික තත්වයන් හා රෝග හා පළිබෝධ මඟින් සිදුවන හානි වලට ඔරොත්තු දෙමින් නව වගාවන් ලෙස අළුතින් ආරම්භ කිරීම මෙහි ප්‍රධාන අභියෝගයක් විය.

තිරසර සංවර්ධන ඉලක්ක කරා යාමේදී, ගෘහස්ථ ඒකකය තුල ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම මඟින් සමස්ත රටේ ජනතාවගේ කුළුබඩු අවශ්‍යතාවය ෙගවතු තුලින් ලබා ගෙන වස විසෙන් තොර ආහාර ලබා ගැනීමේ අරමුණින් යුතුව අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපනය කිරීම හා අපනයන බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන සිදු කරන ලදී. මෙම වැඩසටහන යටතේ ගම්මිරිස්, කුරුඳු, ගොරකා සහ කෝපි පැළ 529,091 ක් ලබා දීමට හැකි විය. මෙම වැඩසටහන සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සීමා වීම හේතුවෙන් ලබා දුන් අපනයන කෘෂිබෝගයන්ට අමතරව කහ, ඉඟුරු, වැනිලා වැනි බෝගයන් ද ගොවීන් වෙත ලබා දිය හැකි වුවද එවැනි බෝග ගෙවතු වගාවන් සඳහා ලබා දීමට නොහැකි වීම අභියෝගයක් විය.

අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ රාජ්‍ය/ රාජ්‍ය නොවන / පුද්ගලික ආයතන විවිධ ප්‍රජා සංවිධාන සමිති මඟින් සිදු කරන ඉල්ලීම් සඳහා මේ යටතේ පැළ ලබා දෙන ලදී.

ඒ ඒ ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික තත්වයන් හා සමාජීය හා කෘෂිකාර්මික කරුණු සැලකිල්ලට ගනිමින් ඉහළ අපනයන විභවයක් පවතින බෝග වර්ග හඳුනාගෙන ආර්ථිකය ශක්තිමත්

කර අපනයන කෘෂි බෝගවල ජාතික නිෂ්පාදන ඉහළ නැංවීම උදෙසා අපනයන කෘෂි කලාප වැඩසටහන 2023 වසර තුලදී ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටෙත් කරාඹු, කරඳමුංගු, කෝපි, වැනිලා , සාදික්කා සහ ගොරකා වගාවන් සඳහා අවශ්‍ය පැළ ලබා දෙන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ දී පරිසර සංරක්ෂණය ප්‍රධාන අංගයක් ලෙස සැලකේ. තිරසාර සංවර්ධන ඉලක්ක අරමුණු කර ගනිමින් වාරිමාර්ග හා ඇළ වේලි දෙපස පුවක් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන 2023 වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පුවක් පැළ 968,300 ක් ෙගාවීන් වෙත නිකුත් කර ඇත. වැට මායිම් සහ ගෙවතු වගාවන් සඳහා පුවක් පැළ ඉල්ලුම පැවැතියද තනි වගාවන් සඳහා පුවක් වගාව ප්‍රචලිත කිරීම අභියෝගයක් විය.

නිරන්තර වෙනස්වීම්වලට ලක්වන කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ට මෙන්ම ස්වභාවික විපත්වලට අනුවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීම මෙන්ම තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තහවුරු කිරීම සඳහා අපනයන බෝග වගාවන්හි ඵලදාව ඉහළ නංවාලීමේ වැඩසටහන 2023 වසරේ දී ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන වගාවන්ට ස්වාභාවිකව සිදුවන නියං හානි වළක්වා ගැනීම සඳහා විසුරුම් ජල පද්ධති / බිංදු ජල සම්පාදන පද්ධති හා පළිබෝධ පාලන ඒකක සඳහා වැයවන වියදමින් 50% ආයෝජන ආධාර මුදල් ලබා දෙන ලදී.ඒ යටතේ පළිබෝධ පාලන ඒකක 16 ක් සහ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 08 ක් ස්ථාපනය වෙනුවෙන් ආයෝජන ආධාර ලබා දෙන ලදී. ඵලදායීතා වර්ධන වැඩසටහන සඳහා ගොවීන් යොමු වීමේ අඩු ප්‍රවණතාවය මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේ අභියෝගයක් විය.

දේශගුණ විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථික රටාවක් කරා යාමේදී කෘෂිකර්මාන්තය පරිසර හිතකාමී පොහොර සහ කෘෂි රසායනික භාවිතයට යොමු කිරීම තුලින් සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය හරහා නීරෝගීමත් ජනතාවක් බිහි කරලීම සඳහා කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. ආර්ථික වර්ධනයට ඉහළ දායකත්වය දරන අපනයන කෘෂි බෝග වගාවන්වලට කාබනික යෙදවුම් නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් හා කාර්යක්ෂම ජල කළමනාකරණය අනුගමනය කිරීම මඟින් වස විසෙන් තොර ගුණාත්මක අපනයන බෝග නිෂ්පාදන කරා යොමු වීමේ අරමුණින් යුතුව වස විසෙන් තොර පරිසර හිතකාමී අපනයන කෘෂි බෝග වගාවන් සඳහා ගොවීන් දිරි ගන්වන ලදී. මෙහිදී කාබනික වගාවන් සඳහා අපනයන බෝග වගාවන් සඳහා නිර්දේශ ක්‍රියාත්මක කරන ලද අතර, එවැනි නිර්දේශයන් අනුගමනය කරනු ලබන ඉඩම් පොකුරු ගොවිපල පද්ධතියක් ලෙස කාබනික සහතිකකරණ වැඩසටහනට සම්බන්ධ කරන ලදී. මෙම අපනයන කෘෂිකර්ම අගය දාම සංවර්ධන වැඩසටහන යටෙත් අපනයන කෘෂි බෝග කාබනික වගාවන් ලෙස පිහිටුවීමේ වැඩසටහන මඟින් ජාත්‍යන්තර කාබනික සහතිකය මේ වන විටත් ලබා ගෙන ඇති ගම්පහ දිවුලපිටිය කාබනික ගම්මානයේ තෙවන වසර සහතිකකරණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන එම ගොවි සංවිධානයට ලබාදෙන ලදී. අපනයන කෘෂි බෝග වගාවන් කාබනික වගාවන් ලෙස පවත්වාගෙන යනු ලබන ඉඩම් ප්‍රමාණය සීමා වීම හේතුවෙන් කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අභියෝගයක් විය.

ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික, සමාජීය හා කෘෂිකාර්මික කරුණු සැලකිල්ලට ගනිමින් ආර්ථිකමය වශයෙන් ඉහල ප්‍රතිලාභයක් ලබා ගැනීමට විභවයක් පවතින අතර අපනයන කෘෂි කලාපයක් තුළ වගාව, නිෂ්පාදන පිරිසැකසුම්කරණය, අගය එකතු කිරීම, විකිණීම සහ අපනයනය මෙන්ම සම්පූර්ණ අගය දාමය සහතික කිරීම, ප්‍රතීතනය සහ කළමනාකරණය කිරීම යනාදී ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදනයේ අගය දාමය සංවර්ධනය කිරීම සිදු කිරීම සඳහා පහසුකම් සැපයීම සිදු කෙරේ. මෙම වැඩසටහන මඟින් ග්‍රාමීය ජනතාව ඒකරාශි කරමින් ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ මෙන්ම නිකේතනීය වෙළඳපොළ ඉලක්ක කොට නිෂ්පාදන සිදු කිරීම අපේක්ෂා කරන ලදී. 2023 වසර තුල අපනයන කෘෂි කලාප වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ කරාඹු, කරඳමුංගු , කෝපි , වැනිලා, සාදික්කා, ගොරකා පැළ 404,537 ක් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී තෝරා ගත් ගම්මාන තුල පමණක් පැළ ලබා දෙන හෙයින් එම ගම්මානයට අයත් නොවන ගම්මානවලින් සිදු කරන ලද පැළ ඉල්ලීම් ලබා දීම අභියෝගයක් විය.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	86	58	28
තෘතියික	29	12	17
ද්විතියික	800	717	83
ප්‍රාථමික	350	337	13
එකතුව	1265	1124	141

6.2 . ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

ශ්‍රී ලංකා විද්‍යාත්මක ශ්‍රේණියේ හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල පවතින පුරප්පාඩු අපනයන කෘෂිහෝග පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු කාර්යක්ෂමව සිදු කර ගෙන යාමට බාධාවක්ව පවතී.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
Phytosanitary Certificate (ස්වස්ථතා සහතිකය ලබා දීම පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	04	දින 01	60,000.00		දේශීය	ස්වස්ථතා සහතිකය ලබා ගැනීමේ ක්‍රමවේදය ස්වස්ථතා සහතිකය නුසුදුසු වීමට හේතු හා තාක්ෂණික ඇගයීම් පිළිබඳ දැනුම.
කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 26	නොමිලේ		දේශීය	තනතුරට අදාල කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කර ගැනීමට අවශ්‍ය දැනුම
ඉඩම් ලිපිගොනු නඩත්තුව සම්බන්ධ පුහුණු වැඩසටහන	11	දින 02	10,500.00		දේශීය	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ දැනුම ලබා ගැනීම (රජය/පුද්ගලික/ LRC ලෙස)
ප්‍රසම්පාදන ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	02	දින 01	නොමිලේ		දේශීය	ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව පවත්වා ගෙන යාම.
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ කළමණාකරණය පිළිබඳ තෛමාසික සහතික පත්‍ර පාඨමාලාව	19	මාස 03			දේශීය	රාජකාරී විනිවිදභාවයකින්, කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයෙන් සිදු කිරීම.
Digital Policy ක්‍රියාත්මක කිරීමේ පුහුණු වැඩසටහන	09	දින 01	නොමිලේ		දේශීය	පරිගණක දත්ත පවත්වා ගැනීම පිළිබඳව කටයුතු කරන ආකාරය පිළිබඳව

පරිගණක දත්ත ගබඩා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	08	දින 01	නොමිලේ		දේශීය	
“CIGAS” පුහුණු වැඩසටහන	100	දින 01	54,724.73		දේශීය	ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල වල පවතින “CIGAS” සම්බන්ධව පවතින ගැටළු නිරාකරණය කර ගැනීම.
මධ්‍යම පැළ තවාන් කළමණාකරණ පුහුණුව	45	දින 02	73,853.26		දේශීය	පැළ තවාන් කළමණාකරණය පිළිබඳ දැනුම
ඒකාබද්ධ භාණ්ඩාගාර කළමණාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීමේ වැඩසටහන (ITMIS)	80	දින 04	392,656.79		දේශීය	ITMIS පද්ධතිය හා එහි ක්‍රියාත්මක වීම පිළිබඳ දැනුම
GAP පුහුණු වැඩසටහන (යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා ප්‍රමිතීන්ට අනුකූලව වූ භාවිත සංග්‍රහය සැකසීම -(ඉහුරු භෝගය)	16	දින 01	12,000.00		දේශීය	තෝරා ගත් අපනයන භෝග සඳහා GAP සහතිකකරණය පිළිබඳ දැනුම
විශේෂ පන්තිය , 1 වන පන්තිය සහ දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරි තනතුරේ සේවය කරන ව්‍යාප්ති නිලධාරීන් සඳහා වූ සේවාස්ථ පුහුණු වැඩසටහන	45	දින 02	73,532.00		දේශීය	තනතුරට අදාළ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටු කර ගැනීමට අවශ්‍ය දැනුම
GAP පුහුණු වැඩසටහන (යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා ප්‍රමිතීන්ට අනුකූලව වූ භාවිත සංග්‍රහය සැකසීම - (වැනිලා භෝගය)	21	දින 01	12,914.00		දේශීය	තෝරා ගත් අපනයන භෝග සඳහා GAP සහතිකකරනය පිළිබඳ දැනුම
කෝපි අතු මඟින් පැළ නිෂ්පාදනය හා බීජ පැළ කිරීමේ දී අනිවාර්යෙන්ම සලකා බැලිය යුතු කරුණු පිළිබඳ පුහුනු වැඩසටහන	50	දින 02	29,984.00		දේශීය	කෝපි අතු පැළ / බීජ පැල මඟින් වගාව සිදු කර ගැනීමට අවශ්‍ය දැනුම

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරෙන අපනයන භෝග පර්යේෂණ සහ ව්‍යාප්ති ක්‍රම, අගය දාම කළමනාකරණය, අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධව යාවත්කාලීන වූ දැනුම සහ අන්තර්ජාතික වශයෙන් තරඟකාරීත්වයක දී අප නිපැයුම් සඳහා ප්‍රමාණතාවන් ලබා ගැනීමට ද ඒ සම්බන්ධ වූ විශේෂිත දැනුම අත්‍යවශ්‍ය වේ. ඒ ඒ බෝග පිළිබඳ අදාල දැනුම පුහුණු වැඩසටහන්වලදී ලබා දේ. ඒ අනුව ලබා ගත් දැනුම ඍජුවම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි සංවර්ධන /පර්යේෂණ වැඩසටහන්වල ඉලක්ක ලඟා කර ගැනීමට ඉවහල් විය. තවද , ඒ ඒ තනතුරු දරන්නන් විසින් දැරිය යුතු ආයතනික පරිපාලනමය වගකීම නිසි පරිදි ඉටු කිරීමට, අඛණ්ඩ පුහුණුව අවශ්‍ය වේ. එමඟින් ආයතනයේ පරිපාලනය, නිසි පරිදි කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට ද ඉවහල් විය.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ	අනුකූල වේ		
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාල නැත.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		අදාල නැත.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම		අදාල නැත.	
1.6	වෙනත්		අදාල නැත.	
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)/	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	මූල්‍ය පාලනය සඳහා කාර්යන්අභිනියෝජනය කිරීම (මු.රෙ.135)	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය ඇස්තමේන්තුවට (NB D) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2)DMA/l-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මු.රෙ.134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	විගණන හා කළමණාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	වත්කම් කළමණාකරණය			
8.1	අංක 01 /201.7 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිළදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරනය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛය සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		ප්‍රමාදයක් සිදු ව ඇත. ඉදිරියේ දී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කොට තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොක් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ		2023 වර්ෂයේ සියළුම වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීම සීමා කිරීමත් QR බෙදීතය යටතේ ඉන්ධන නිකුත් කිරීමේ හේතුවෙනුත් ඉන්ධන වියදම් දැඩි ලෙස සීමා කිරීමට සිදුවීමෙනුත් ඉන්ධන දහනය පරීක්ෂාව නොකරන ලදි.
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගැනීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමණාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.		අක්‍රිය බැංකු ගිණුම් නොමැත	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම		.	
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලබීම.	අනුකූල වේ		
12	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පතු ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කාර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමණාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ.		2023.01.27 BD/CBP/01/01/05/2022 දරණ අයවැය චක්‍ර ලේඛ අංක 1/2023 හි 6 (ඇ) ඡේදය අනුව පුහුණු කටයුතු දැඩිව සීමා කිරීමට සිදු විය.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව -2023.

නිෂ්පාදනය	ඒකකය		ආනයන	අපනයන
කුරුඳු	පරිමාව	මෙට්‍රික් ටොන්	16.49	19,676.55
	වටිනාකම	රු. මි	87.25	68,560.03
කුරුඳු කොළ තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.05	198.39
	වටිනාකම	රු. මි	0.74	958.89
කුරුඳු පොතු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.25	6.68
	වටිනාකම	රු. මි	0.35	466.94
කරාඹු	පරිමාව	මෙට්‍රික් ටොන්	10.00	4,283.06
	වටිනාකම	රු. මි	22.64	13,061.90
කරාඹු නැටි	පරිමාව	මෙට්‍රික් ටොන්		1,558.42
	වටිනාකම	රු. මි		1,762.79
කරාඹු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.02	10.64
	වටිනාකම	රු. මි	20.15	168.65
කොකෝවා	පරිමාව	මෙට්‍රික් ටොන්	4669.14	1,985.09
	වටිනාකම	රු. මි	8846..52	5,649.56
කෝපි	පරිමාව	මෙට්‍රික් ටොන්	361.88	34.71
	වටිනාකම	රු. මි	1209.10	145.83
ගම්මිරිස්	පරිමාව	මෙට්‍රික් ටොන්	43.54	14,254.94
	වටිනාකම	රු. මි	97.87	29,329.45
ගම්මිරිස් තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.65	64.19
	වටිනාකම	රු. මි	1.47	692.53
ඔලියරොසින්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.34	188.67
	වටිනාකම	රු. මි	21.88	2,371.56
කරඳමුංගු	පරිමාව	මෙට්‍රික් ටොන්		7.59
	වටිනාකම	රු. මි		438.99
කරඳමුංගු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.04	0.61
	වටිනාකම	රු. මි	0.80	56.31
පැණිරි	පරිමාව	මෙට්‍රික් ටොන්	0.03	0.75
	වටිනාකම	රු. මි	0.02	6.49
සේර	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	394.88
	වටිනාකම	රු. මි	0.01	2,061.71
සාදික්කා	පරිමාව	මෙට්‍රික් ටොන්		2,323.04
	වටිනාකම	රු. මි		4,571.05
වසාවාසි	පරිමාව	මෙට්‍රික් ටොන්		394.88
	වටිනාකම	රු. මි		2,061.71
වසාවාසි තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්		1.24
	වටිනාකම	රු. මි		25.17
සාදික්කා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්		63.17
	වටිනාකම	රු. මි		1,152.85
වැනිලා	පරිමාව	මෙට්‍රික් ටොන්	0.59	5.56
	වටිනාකම	රු. මි	3.88	456.63
වැනිලා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.84	0.64
	වටිනාකම	රු. මි	3.56	1.34
පුවක්	පරිමාව	මෙට්‍රික් ටොන්		14,051.38
	වටිනාකම	රු. මි		19,686.13
බුලත්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.05	3,555.89
	වටිනාකම	රු. මි	0.03	4,856.70
ඉඟුරු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.80	98.13
	වටිනාකම	රු. මි	0.92	232.20
ඉඟුරු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	1.02	5.71
	වටිනාකම	රු. මි	15.30	109.20
කහ	පරිමාව	මෙට්‍රික් ටොන්		89.28
	වටිනාකම	රු. මි		262.40
ගොරකා	පරිමාව	මෙට්‍රික් ටොන්	68.13	117.95
	වටිනාකම	රු. මි	123.19	220.19
එකතුව	**පරිමාව**	**මෙට්‍රික් ටොන්**	**5,199.98**	**63,232.77**
	වටිනාකම	**රු. මි**	**10,737.94**	**157,423.36**

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2023





+ 94 812 388651

helpdesk@dea.gov.lk

www.dea.gov.lk

1095, Getambe, Peradeniya, Sri Lanka.

අතමිටුසරු හොඳ දිනකට...

Cover Designed@ COM DIV | DEA